සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது /All Right Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

# අවසාන වාර පරීක්ෂණය- 2024

ශ්‍රේණිය / தரம் / Grade 13-1 (21) ආර්ථික විද්‍යාව- 1 කාලය / நேரம் / Time පැය 2

නම / பெயர் / Name ........................................................ විභාග අංකය / சுட்டிலக்கம் / Exam No. ........................

**උපදෙස් ;**

☸සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
☸උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
☸ 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත්ම ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.

1. පහත සඳහන් ප්‍රකාශ අතුරින් අභිමතානුරූපී සාවර් ආර්ථික විද්‍යාවට අදාළ ප්‍රකාශය වනුයේ කුමක් ද?
   (1) ආර්ථික නොවන භාණ්ඩයක ආන්තික පිරිවැය ශූන්‍ය වෙයි.
   (2) ආර්ථික විද්‍යා විෂයෙහි කේන්ද්‍රීය ගැටළුව සම්පත් හිඟකමයි.
   (3) ආර්ථිකයක උද්ධමන වේගය මණිනු ලබන්නේ මිල දශර්කයන් වල වැඩිවීමේ ප්‍රතිශතය මගිනි.
   (4) ආර්ථික වෘද්ධිය ඉහළ නැංවීමට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යොදාගත යුතුය.
   (5) ශ්‍රී ලංකාවේ 2023 වශර්යේ ආර්ථික වෘද්ධි අනපාතය -2.3% කි.

2. පාරිභෝජන භාණ්ඩ , අන්තර් භාණ්ඩ හා ප්‍රාග්ධන භාණ්ඩ සම්බන්ධ ප්‍රකාශ කීපයක් පහතින් දැක්වෙයි.
   (අ) ප්‍රාග්ධන භාණ්ඩ ෙමන්ම අන්තර් භාණ්ඩ නිෂ්පාදකයින්ගේ භාණ්ඩ ලෙස සැළකෙයි.
   (ආ) පරිභෝජන භාණ්ඩ , වෙනත් භාණ්ඩ නිෂ්පාදනයට යොදා ගැනෙයි.
   (ඉ) පරිභෝජන භාණ්ඩ කෙටි කාලීන හා දිගු කාලීන වශයෙන් ද හමු වෙයි.
   (ඊ) පරිඝණකයක්, ප්‍රාග්ධන භාණ්ඩයක් පමණක් වෙයි.
   (උ) අන්තර් භාණ්ඩ නිෂ්පාදන ක්‍රියා වලියට ඇතුළු වී නිමැවුම තව දුරටත් පෝෂණය කරයි.
   (ඌ) ප්‍රාග්ධන භාණ්ඩ වල ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනයක් නැත.

   ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශ පමණක් ඇතුළත් පිළිතුරු කාණ්ඩය වනුයේ කුමක් ද?
   (1) (අ) (ආ) (ඉ) (2 ) (ආ) (ඉ) (උ) 3) (අ) (ඉ) (උ)
   (4) (අ) (උ) (ඌ) (5) (ආ) (ඉ) (ඌ)

3. ආර්ථික පද්ධතියක් තුළ දැකගත හැකි ලක්ෂණ කීපයක් පහත පරිදි වේ.

A පෞද්ගලික දේපොළ අයිතිය          B මිල යාන්ත්‍රණයෙන් සම්පත් බෙදා හැරීම.

C රාජ්‍ය දේපොළ හිමිකාරිත්වය          D සැළසුම් යාන්ත්‍රණයක් ක්‍රියාත්කවීම


E ආදායම් පුනර්ව්‍යාප්තිය හා පුළුල් සමාජ ආරක්ෂණ ජාල ක්‍රියාත්මක වීම.

F ලාභයෙන් සානුබල ලැබීම          G සමාජ සුභ සාධනය මගින් සානුබල ලැබීම.

ඉහත ලක්ෂණ අතුරින් සමාජවාදී සැලසුම්ගත ආර්ථික පද්ධතියක් සඳහා වඩාත් නිවැරදි ප්‍රකාශ දැක්වෙන අක්ෂර ඇතුළත් කාණ්ඩය වනුයේ කුමක් ද?

(1) B, C, D    (2) A, B, E    (3)A,D, E    (4) C, D, G    (5) B, C,E


4. එක්තරා ආර්ථිකයක නිෂ්පාදන හැකියා මායිම පහත රූප සටහනේ දැක්වේ.




නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත A ලක්ෂ්‍යයේ සිට B ලක්ෂ්‍ය දක්වා මාරුවන විට ඉන් අදහස් කෙරෙනුයේ,

(1) ආර්ථිකයේ නිෂ්පාදන කාර්යක්ෂමතාවය තව දුරටත් ඉහළ යන බවය.
(2) ආර්ථිකයේ සම්පත් වැඩි වශයෙන් උපයෝජනයට යොදා ගැනෙන බවය.
(3) ආරක්ෂක භාණ්ඩ නිෂ්පාදනයට අදාළ සම්පත් සිවිල් භාන්ඩ නිෂ්පාදනයට පරිවර්තනය වන බවය.
(4) ආරක්ෂක භාණ්ඩ නිෂ්පාදන ඒකකයක ආවස්ථික පිරිවැය පහළ වැටෙන බවය.
(5) ආරක්ෂක භාණ්ඩ නිෂ්පාදන ඒකකයක ආවස්ථික පිරිවැය ඉහළ නගින බවය.

5. .කිසියම් භාණ්ඩයක ඉල්ලුම් වක්‍රය පහතින් දැක්වේ.




මෙම භාණ්ඩයට අදාළ ඉල්ලුම් සමීකරණය ව්‍යුත්පන්න කළ විට, අදාළ සමීකරණය වනුයේ කුමක්ද?

(1) Qd = 150 – 25p    (2) Qd = 200 – 25p    (3) 150 – 75p

(4)Qd = 250 – 50p    (5) Qd = 300 – 25p

6. එක්තරා භාණ්ඩයක් සඳහා පැවති ඉල්ලුම් සමීකරණය Qd = 1000 – 20p වේ. අධි ඉල්ලුම් සමීකරණය EQd = 1200 – 40p වේ. මෙම භා්ණඩයේ සමතුලිත මිල සහ සමතුලිත අවස්ථාවේ පාරිභෝගික අතිරික්තය පිළිවෙලින්,
(1) රු. 30 ක් සහ රු.4000 කි. (2) රු. 30 ක් සහ රු.8000 කි.
(3) රු. 30 ක් සහ රු.5000 කි. (4) රු. 40 ක් සහ රු.4000 කි.
(5) රු. 30 ක් සහ රු.200 කි.

7. එක්තරා භාණ්ඩයක ආදායම් ඉල්ලුම් නම්‍යතාවය ඍණ වෙයි. මෙම භාණ්ඩය සම්බන්ධයෙන් වඩාත් ගැලපෙන සංයෝජනය වනුයේ කුමක් ද?

| | මිල වෙනස්වීම | ආදේශන ප්‍රතිවිපාකයේ බලපෑම අනුව ඉල්ලුම් ප්‍රමාණය | ආදායම් ප්‍රතිවිපාකයේ බලපෑම අනුව ඉල්ලුම් ප්‍රමාණය | මිල ප්‍රතිවිපාකයේ බලපෑම අනුව ඉල්ලුම් ප්‍රමාණය |
|---|---|---|---|---|
| (1) | වැඩිවේ. | අඩු වේ. | අඩුවේ. | අඩුවේ. |
| (2) | අඩු වේ. | අඩුවේ. | අඩුවේ. | අඩුවේ. |
| (3) | අඩු වේ. | වැඩිවේ. | වැඩිවේ. | වැඩිවේ. |
| (4) | වැඩිවේ. | අඩුවේ. | අඩුවේ. | වැඩිවේ. |
| (5) | වැඩි වේ. | අඩුවේ. | වැඩිවේ. | අඩුවේ. |

8. ශ්‍රී ලංකාව ලෝක වෙළෙඳ පොළ තුළ බලවත් නැති කුඩා සැපයුම් කරුවෙකි. ශ්‍රී ලංකාව අපනයනය කරන තේ සඳහා පවතින්නේ,
(1) අපරිමිත නම්‍යතාවයක් ගනු ලබන ඉල්ලුම් වක්‍රයකි.
(2) අපරිමිත නම්‍යතාවයක් ගනු ලබන සැපයුම් වක්‍රයකි.
(3) මිල අක්ෂයට සමාන්තර ඉල්ලුම් වක්‍රයකි.
(4) පහතට බෑවුම් වන ඉල්ලුම් වක්‍රයකි.
(5) ඉහළට බෑවුම් වන සැපයුම් වක්‍රයකි.

9. කිසියම් භාණ්ඩයක මිල වැඩිවීමක් මුළු අයභාරයෙහි අඩුවීමක් ඇති කරනු ලැබේ නම්,
(1) භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම අනම්‍ය විය යුතුය.
(2) භාණ්ඩයේ නිර්වචනය පුළුල් විය යුතුය.
(3) භාණ්ඩය සඳහා ඇති සමීප ආදේශක අඩු විය යුතුය
(4) භාණ්ඩයේ නිර්වචනය පටු විය යුතුය.
(5) භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම ශුන්‍ය නම්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

10. තරඟකාරී වෙළෙඳ පොළක එක්තරා භාණ්ඩයක ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත පරිදි වෙයි. Qd =200 – p හා Qs = p ඉහත භාණ්ඩයට ඇති සැපයුම් කරුවන්ගේ වෙනස්වීමක් හේතුවෙන් සැපයුම් සමීකරණය, Qs = - 20 +p ලෙසට වෙනස් විය. මෙවැනි තත්ත්වයක් ඇතිවිය හැක්කේ සහ ඇතිවිය හැකි ප්‍රතිවිපාකය වනුයේ, සැපයුම් කරුවන් සංඛ්‍යාව,
(1) වැඩිවීම හේතුවෙන් සමතුලිත මිල රු.110 සිට 100 දක්වා වෙනස් වීමයි.
(2) අඩුවීම හේතුවෙන් සමතුලිත මිල රු.100 සිට 110 දක්වා වෙනස් වෙනස් වීමයි.
(3) වැඩිවීම හේතුවෙන් සමතුලිත ප්‍රමාණය ඒකක 90 සිට 100 දක්වා වැඩි වීමයි.
(4) අඩුවීම හේතුවෙන් සැපයුම් වක්‍රය වමට විතැන් වුවත් සමතුලිත මිල වෙනස් නොවීමයි.
(5) වැඩිවීම හේතුවෙන් සැපයුම් වක්‍රය දකුණට විතැන් වී සමතුලිත ප්‍රමාණය ඉහළ යාමයි.

11. සරල රේඛීය සැපයුම් වක්‍රයක සැපයුම් නම්‍යතාවය සම්බන්ධ පහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

| | තිරස් අන්තඃඛණ්ඩය | සැපයුම් නම්‍යතා සංගුනකය | මිල වැඩිවන විට සැපයුම් නම්‍යතාවය |
|---|---|---|---|
| (1) | ධන | එකට වැඩි | වැඩිවේ. |
| (2) | ඍණ | එකට අඩු | වැඩිවේ. |
| (3) | ධන | එකට අඩු | අඩුවේ. |
| (4) | ඍණ | එකට අඩු. | අඩු ව. |
| (5) | ඍණ | එකට වැඩි. | අඩු වේ. |


12. පහත දැක්වෙන්නේ එක්තරා භාණ්ඩයකට අදාළ ඉල්ලුම් සැපයුම් ලේඛණය කි.

| | | | |
|---|---|---|---|
| මිල | 10 | 20 | 30 |
| ඉල්ලුම් ප්‍රමාණය | 400 | 300 | 200 |
| සැපයුම් ප්‍රමාණය | 300 | 400 | 500 |

රජය මෙම භාණ්ඩය සඳහා රු. 10/= ක ඒකක බද්දක් නිෂ්පාදකයා මත පනවක ලදී. බද්දට පසු ඒකකයක් සඳහා පරිභෝගිකයා ගෙවන මිල වන්නේ,

(1)රු. 5/= (2) රු. 10/= (3) රු. 15 /= (4) රු. 20/= (5)රු. 25/=

13. පහත දැක්වෙන්නේ එක්තරා භාණ්ඩයකට අදාළ ඉල්ලුම් හා සැපයුම් වක්‍රයන් වේ.




මෙම භාණ්ඩය මත රජය විසින් රු. 15/= ක අවම මිලක් නියම කරන ලදී. අවම මිලෙන් පසු නිෂ්පාදන අතිරික්තය වන්නේ,

(1)562.50 (2) 720 (3) 843.75 (4) 900 (5) 1125

(14) ස්වාරක්ෂක තොග පවත්වාගෙන යැම නිසා ,

(1) පාරිභෝගිකයන්ට අඩු මිලට භාණ්ඩ පරිභෝජනය කළ හැකිවේ.
(2) නිෂ්පාදකයින් ට තම නිෂ්පාදනය සඳහා ඉහළ මිලක් හිමි වේ.
(3) තොග පවත්වාගෙන යාමේ අමතර පිරිවැයක් දැරීමට සිදු නොවේ.
(4) කෘෂි නිෂ්පාදන වල මිල ස්ථාවර මට්ටමක පවත්වා ගෙන යා හැකිය.
(5) යුධකාරී තත්ත්වයක් තුළ ආහාර ආරක්ෂා කර ගැනීමේ හොඳ උපක්‍රමයක් වේ.

(15) ස්ථාවර පිරිවැයට අයත් සංරචකයක් වන්නේ,

(1)අමුද්‍රව්‍ය මිලට ගැනීම් (2) සේවක වැටුප් ගෙවීම්.


(3)විදුලි වියදම්. (4) රක්ෂණ වාරික ගෙවීම්. (5) බිල්පත් ගෙවීම්.

(16) විචල්‍ය සාධක වැඩි කරන විට, සාමාන්‍ය ඵලදාව (AP)හා ආන්තික ඵලදාව(MP)අඩු වන විට , මුළු ඵලදාව (TP) ,

(1) වැඩි වේගයකින් ඉහළ යයි. (2) අඩු වේගයකින් ඉහළ යයි.

(3)මුළු ඵලදාව අඩු වේ. (4) ස්ථාවර වේ. (5)වෙනස් නොවේ.

(17)




ඉහත ඇක්වෙන්නේ පූර්ණතරඟකාරී ආයතනයකට සම්බන්ධ පිරිවැය හැසිරීම වේ. ඊට අනුකූලව නිවැරදි පිළිතුර තෝරන්න.

(1) සමතුලිත අවස්ථාවේ මුළු අයභාරය රු. 1500 කි.
(2) සමතුලිත අවස්ථාවේ මුළු පිරිවැය රු. 200 කි.
(3) සමතුලිත අවස්ථාවේ නිෂ්ප්‍රාමාණික ලාභය රු.300 කි.
(4) සමතුලිත අවස්ථාවේ මුළු විචල්‍ය පිරිවැය 1200 කි.
(5) රු. 12 ට වඩා භාණ්ඩයේ මිල අඩු වේ නම් ආයතනය වසා දමයි.

(18) ඒකාධිකාරී තරඟ වෙළෙඳ පොළකට , පමණක් නිදසුන් සහිත පිළිතුර වන්නේ,

(1) රූපවාහිනී සේවා, ආපන ශාලා, කැරට්
(2) කැරට් , වට්ටක්කා, වානිජ බැංකු
(3) ගෑස් බෙදා හැරීම, ආපන ශාලා, පුවත්පත්.
(4) රූපලාවන්‍ය ආයතන, සෙරෙප්පු, ආපනශාලා
(5) සිමෙන්ති කම්හල් , දුම්රිය සේවාව, සබන්.

(19) සාවර් ආර්ථික ප්‍රතිපත්ති යනු,

(1) මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගන්නා ආකාර දැක්වීමට ඇති කර ගන්නා ප්‍රතිපත්ති වේ.
(2) සාවර් ආර්ථික අරමුණු කරා ආර්ථිකය මෙහෙය වීමට ගනු ලබන ආර්ථික ප්‍රතිපත්ති වේ.
(3)රජයේ ණය හා එහි පිරිවැය වන පොලී අනුපාතය පාලනය කිරීම තුලින් ආර්ථික ස්ථායීතාව ඇති කිරීමේ ප්‍රතිපත්ති වේ.
(4) සාවර් ආර්ථිකය තුළ මුදල් සැපයුම හා පොලිය, රාජයේ ආදායම ,වියදම හා ණය , සැපයුම් ප්‍රවධර්නය , ආදායම් හා ඍජු පාලනය සම්බන්ධ ප්‍රතිපත්ති වේ..
(5)සාවර් ආර්ථිකය තුළ රජය බදු අය කිරීමත් සහනාධාර දීමත් හා රජය භාණ්ඩ හා සේවා මිලදී ගැනීමත් කළමණාකරණ කිරීමේ ප්‍රතිපත්ති වේ.

(20) විවෘත ආර්ථිකයක ආර්ථික කාරක වන්නේ,

(1) කුටුම්භ පරිභෝජනය , රජයේ පරිභෝජනය, ආයෝජනය හා ශුද්ධ අපනයන වේ.

(2) ආදායම් වියදම් හා නිෂ්පාදනය වේ.

(3) කුටුම්භ ,රජය, වෙළෙඳ පොළවල් හා ව්‍යාපාරයි.

(4) ශ්‍රමිකයන්, ප්‍රාග්ධන හිමියන්, ව්‍යවසායකයන්, හා භූමියේ හිමිකරුවන්ය.

(5) කුටුම්භ, නිෂ්පාදන, රාජ්‍ය හා විදේශ අංශය වේ.

(21) දළ දේශීය වියදම හා වැය කළ හැකි ජාතික ආදායම අතර වෙනස වන්නේ විදේශ ගිණුම් වල,

(1) ශුද්ධ අපනයන වේ.

(2) ශුද්ධ අපනයන හා ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය වේ.

(3) ශුද්ධ අපනයන හා ද්විතීක ආදායම් ගිණුමේ ශේෂය වේ.

(4) ප්‍රාථමික ආදායම් හා දිවිතීක ආදායම් වේ.


(5) වතර්න ගිණුමේ ශේෂයයි.

(22) කිසියම් රටක දළ දේශිය වියදම 500 ක් වන අතර ශුද්ධ අපනයන -100 කි. ආනයන 150 කි. කුටුම්භ හා රජයේ පරිභෝජනය 350 කි . (සියළු දත්ත රු.මි. වලිනි.) මෙම තොරතුරු අනුව , වෙළෙඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය, දේශීය ඉතුරුම් හා සම්පත් උපයෝජනය වන්නේ පිළිවෙලින් රු.මි.

(1) 400 , 50, 550 (2) 350 , 200 , 350 (3) 350 , 50, 550

(4) 400 , 50 , 450 (5) 600 , 250 , 650

(23)




කිසියම් ආර්ථිකයක් සම්බන්ධ සාවර් ආර්ථික තොරතුරු ඉහත ප්‍රස්ථාර සටහනින් දැක් වේ. ඊට අනුකූලව මෙම ආර්ථිකයේ **ආන්තික පරිභෝජන නැමියාව** හා $E_1$ සමාහාර ඉල්ලුම් අවස්ථාවේ ස්වාධීන වියදම් හෙවත් **ආදායම ශුන්‍ය අවස්ථාවේදීත් පවතින සමාහාර ඉල්ලුම** (a වල අගය) වන්නේ පිළිවෙලින්,

(1) 0.25 හා 520 වේ. (2) 0.6 හා 800 වේ. (3) 0.8 හා 400 වේ.

(4) 0.75 හා 800 වේ. (5) 0.4 හා 80 වේ.

(24) එක්තරා ආර්ථිකයක ආන්තික ඉතුරුම් නැමියාව 0.2 ක් වූ අතර, රජය බදු රු.මි. 150 කින් වැඩි කොට ඉන් 50% සහනාධාර ලෙස ලබා දී ඉතිරිය රාජ්‍ය සේවා පවත්වා ගෙන යාමට භාණ්ඩ හා සේවා මත වියදම් කරන ලදී. මේ අනුව ආර්ථිකයේ සමතුලිත නිමැවුම,

(1) 200 කින් සංකෝචනය වේ. (2) 200 කින් ප්‍රසාරණය වේ.

(3) 100 කින් සංකෝචනය වේ. (4) 75 කින් ප්‍රසාරණය වේ.

(5) තොරතුරු අනුව ස්ථිරව කිව නොහැකිය.

(25) ආර්ථික අවපාතයකට නතුව සිටින රටක රජය විසින් කළ යුතු වඩාත් වැදගත් කතර්ව්‍ය වන්නේ,
(1) භාණ්ඩ හා සේවා මත බදු පනවා පරිභෝජනය සීමා කරවීමයි.
(2) ඍජු බදු අයකිරීම් වැඩි කොට සමාහාර ඉල්ලුම පාලනය කිරීමයි.
(3) රජයේ සහනාධාර වියදම් අය කරනු ලබන බදු වලට වඩා අඩු කළ යුතුය.
(4) බදු ආදායම ඉක්මවා භාණ්ඩ හා සේවා මිල දී ගැනීමට රජය යොමු විය යුතුය.
(5) අවපාතයකදී රාජ්‍ය වියදම් කපා හා බදු අයකිරීම වැදගත්ම කායර් භාරයයි.

(26) භාණ්ඩ හුවමාරු ක්‍රමයේ පැවති ප්‍රධාන දුවර්ලතාවය වනනේ,
(1) වටිනාතකම මැනීමට නොහැකි වීම.
(2) රැගෙන යාමේ අපහසුව,
(3) වටිනාකම රැස් කිරීමට නොහැකි වීම.
(4) ණය ගණුදෙනු පියවීමේ දී ගැටළු මතුවීම.
(5) ද්විත්ව සමපාතයක් අවශ්‍ය වීම .

(27) රටක මහජනයා සතුව කාසි හා නෝට්ටු මිලියන 200 ක් පවතින අතර, මහජනයා සතු ඉල්ලුම් තැන්පතු මිලියන 500 කි. වානිජ බැංකු සතු කාසි හා නෝට්ටු ප්‍රමාණය මිලයන 150 කි. මෙහි පටු මුදල් ගුනකය වන්නේ,
(1) 0.5 (2) 0.7 (3) 2 (4) 2.1 (5) 3.5

(28) ප්‍රාග්ධන වෙළෙඳ පොලෙහි පවතින උප වෙළෙඳ පොළක් වන්නේ,
(1) භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳ පොළ
(2) භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳ පොළ
(3) විදේශ විනිමය වෙළෙඳ පොළ
(4) වානිජ පත්‍රිකා වෙළෙඳ පොළ
(5) අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳ පොළ

(29) ශ්‍රී ලංකාවේ නාමික දළ දේශීය නිෂ්පාදනය 20% කින් ඉහළ යන ලදී. එවිට මුදලේ සංසරණ ප්‍රවේගය 4% කින් අඩු විය. මේ නිසා මුදල් සැපයුම,
(1) 5% කින් ඉහළ යයි. (2) වෙනස් නොවේ. (3)20% කින් වැඩි වේ.
(4)24% කින් වැඩිවේ. (5) 16% කින් වැඩි වේ.

(30) මත්පැන් දුම්වැටි වැනි පරිභෝජනයේ ඍණ බාහිරතා ජනනය කරන භාණ්ඩ සම්බන්ධයෙන්, ( වෙළෙඳ පොළ ක්‍රමය තුළ) වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) පෞද්ගලික පිරිවැයට වඩා සමාජ පිරිවැය අඩු වේ.
(2) වෙළෙඳ පොළ මිලට වඩා ප්‍රශස්ත මිල අඩු අගයක් ගනී.
(3) ඌණ නිෂ්පාදනයක් සිදු වේ.
(4) බාහිර ප්‍රතිලාභයක් ඇති වේ.
(5) වෙළෙඳ පොළ නිමැවුමට වඩා ප්‍රශස්ථ නිමැවුම වැඩි වේ.

(31) බදු පදනම පුළුල් වන විට, ගෙවිය යුතු බදු ප්‍රතිශතය ද විශාල වන බදු වගර්යක් වන්නේ,
(1) මත්පැන් හා දුම්කොළ බදු. (2) නිෂ්පාදන බදු (3) ආදායම් බදු
(4)පොදු විකුණුම් භාණ්ඩ බදු (5) එකතු කළ අගය මත බදු

(32) 2023 වෂර්යේ රජයේ වතර්න වියදමින් වැඩි ප්‍රමාණයක් වැය කර ඇති වියදම වන්නේ,

(1) රාජ්‍ය සේවක වැටුප් ගෙවීම.

(2) රජයට අවශ්‍ය භාණ්ඩ හා සේවා මිලට ගැනීම.

(3) රාජ්‍ය ණය සඳහා පොලී ගෙවීම.

(4) විශ්‍රාම වැටුප් ගෙවීම.

(5) පසැල් ළමුන්ගේ නිළ ඇඳම් හා පෙළපොත් සඳහා.

| | |
|---|---|
| (33) රාජ්‍ය ආදායම | රු.මි. 500 |
| වර්‍රන වියදම | රු.මි. 700 |
| ප්‍රාග්ධන වියදම් | රු.මි. 300 |
| රාජ්‍ය ණය පොලී ගෙවීම් | රු.මි. 200 |
| විදේශ ප්‍රදාන | රු.මි. 100 |

ඉහත දත්තයන්ට අනුකූලව රාජ්‍ය අයවැය සම්බන්ධ ප්‍රාථමික ගිණුමේ ශේෂය රු.මිලියන කොපමණ ද?

(1)-500 (2) -400 (3) -300 (4) – 200 (5) -100

(34) 2022 වසරේ මුළු ණය සේවාකරණ ගෙවීම් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස,

(1) 11.4 (2) 12.5 (3) 13.5 (4) 14 (5) 15.4

(35) තෙරපුම් ප්‍රතිවිපාය ලෙස අදහස් කරන්නේ,

(1) විදේශ ආයෝජකයන්ට බදු අයකිරීම නිසා ආයෝජනය සීමා වීමයි.

(2) විදේශ සම්බාධක පැනවීම නිසා අමුද්‍රව්‍ය හිඟවීමෙන් දේශීය නිෂ්පාදිතය සීමා වීමයි.

(3) රාජ්‍ය අයවැය හිඟය අවම කිරීමට බදු වැඩි කිරීම නිසා දේශිය ආයෝජකයන් අධෛර්‍යමත් වීමයි.

(4) ආර්ථිකය තුළ පවතින්නා වූ අරගල නිසා දේශීය නිෂ්පාදිතය අඩපන වීම හා විදේශීය ආයෝජනය , සංචාරක ව්‍යාපාරය ආදිය අඩපන වීමයි.

(5) අයවැය හිඟය පියවීමට රජය ණය ගැනීම නිසා දේශීය ආයෝජනයට ණය ගැනීම සීමා වීමත්, පොලී අනුපාතිකය ඉහළ යාමත්ය.

(36) සාපේක්ෂ වාසි න්‍යාය ඉදිරිපත් කරන්නේ ද උපකල්පන පදනම් කර ගනිමිනි එසේ උපකල්පනයක් **නොවන** ප්‍රකාශය වන්නේ,

(1) ආවස්ථික පිරිවැය අනුව රටවල් දෙකටම ජාත්‍යන්තර වෙළෙඳාමට සහභාගිවිය හැකි බව.

(2) පූර්ණ සාධක සංචලතාවක පවතින බව.

(3) ස්ථාවර පරිමාණානුකූල පවතින බව.

(4) ප්‍රවාහණ පිරිවැය සැළකිල්ලට නොගන්නා බව.

(5) නිෂ්පාදනය හෝ පරිභෝජනය ආශ්‍රිතව බාහිරතා හට නොගන්නා බව.

(37) ජාත්‍යන්තර වෙළෙඳාමට සම්බන්ධ වූ ආර්ථිකයක භාණ්ඩ ආනයනය කරන අතර, ආනයනික බල්බයක මිල රු. 500 කි .මෙම භාණ්ඩය අදාළ රට තුළ ද නිෂ්පාදනය කරන අතර ඒ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය කිරීමට රු. 400 ක් වැය වේ. රජය මැදිහත් වී ආනයනික අමුද්‍රව්‍ය මත 10% ක බද්ධක් ද , නිමි භාණ්ඩ මත 20% ක බද්ධක් ද අය කරනු ලබයි නම්, සඵල ආරක්ෂණ අනුපාතිකය වන්නේ,

(1) 20% (2) 40% (3) 60% (4) 80% (5) 100%

(38) ළදරු කමර්ාන්ත ආරක්ෂනය යනු,

(1) ආරම්භක අවස්ථාවේ පවතින දේශීය කමර්ාන්ත ආරක්ෂා කිරීමයි.

(2) ළදරුවන් සඳහා පවතින්නා වූ දේශීය කරමාන්ත රැක ගැනීමයි.

(3) ළදරුවන් පිට රටට විකිණීමේ ව්‍යාපාරයෙන් ළදරුවන් ආරක්ෂා කර ගැනීමයි.

(4) ළදරු කිරිපිටි වල දේශීය නිෂ්පාදනය වැඩි කරමින් විදේශ ආනයන වැළැක්වීමයි.

(5) අසරණ වූ ළදරුවන් රැක බලා ගැනීම සඳහා ආයතන ඇති කිරීමයි.

(39) විදේශ වෙළෙඳ අනුපාතය යනු,

(1) මුළු අපනයන ආදායමින් ලබා ගත හැකි ආනයන ප්‍රමාණයයි.

(2) භාණ්ඩ අපනයන ඒකකයක් වෙනුවෙන් ලබා ගත හැකි ආනයන භාණ්ඩ ඒකක ප්‍රමානයයි.

(3) රටක ආනයන ශක්‍යතාවයයි.

(4) අපනයන මිල දශර්කය ආනයන මිල දශර්කයෙන් බෙදා අපනයන පරිමා දශර්කයෙන් ගුණ කිරීමෙන් ලබා ගන්නා ප්‍රතිශතයයි.

(5)ආනයන මිල දශර්කය අපනයන මිල දශර්කයෙන් බෙදා ප්‍රතිශතයක් ලෙස දැක්වීමයි..

(40) ගෙවුම් ශේෂයේ මූල්‍ය ගිණුමට අයත් සංරචක වන්නේ,

(1) ඍජු ආයෝජන, කළඹ ආයෝජන, දේශීය ආයෝජන හා වෙනත් ආයෝජනයි.

(2) කාමරීක ආයෝජන, කළඹ ආයෝජන, මූල්‍ය ව්‍යුත්පන්න, සංචිත වත්කම් හා වෙනත් ආයෝජනයි.

(3) ඍජු ආයෝජන, කළඹ ආයෝජන, වෙනත් ආයෝජන, කාරමික ආයෝජන හා මූල්‍ය ව්‍යුත්පන්නයි.

(4) සංචිත වත්කම්, වෙනත් ආයෝජන, මූල්‍ය ව්‍යුත්පන්න, කළඹ ආයෝජන හා ශුද්ධ ණයදීම්.

(5) විදේශ සංචිත වත්කම්, මූල්‍ය ව්‍යුත්පන්න, කළඹ ආයෝජන, ඍජු ආයෝජන හා වෙනත් ආයෝජනයි.

(41) ගෙවුම් ශේෂයේ සමස්ත ශේෂය ලෙස ගණනය කරනු ලබන්නේ,

(1) ජාත්‍යන්තර සංචිත වල ශුද්ධ වෙනස්වීම් හෙවත් වසර අවසානයේ පවතින සංචිත වලින් වසර මුල පැවති සංචිත ප්‍රමාණය අඩු කිරීමෙනි

(2) වතර්න ගිණුම, ප්‍රාග්ධන ගිණුම හා සමස්ථ මූල්‍ය ගිණුමේ ශේෂය හෙවත් රජයේ ආදායමින් වියදම් අඩු කිරීමෙනි.

(3) රජයේ සම්ස්ථ විදේශ විනිමය ලැබීම් වලින් භාණ්ඩ හා සේවා ආනයනයට කරන ලද ගෙවීම් අඩු කිරීමෙනි.

(4) රජයේ මුළු විදේශ ආදායමින් හා භාණ්ඩ හා සේවා අපනයනය කිරීම තුලින් උපයන ආදායමින් සමස්ත භාණ්ඩ හා සේවා ආනයනයට ගිය මුදල් අඩු කිරීමෙනි.

(5) ඍජු ආයෝජන ඇතුළත් වසරේ ඉපයූ මුළු විදේශ විනිමය ප්‍රමාණයෙන්, වසර අගතෙක් වියදම් කළා වූ මුළු විදේශ විනිමය ප්‍රමාණය අඩු කිරීමෙනි.

(42) ශ්‍රී ලංකා ආථරීකයෙහි ගෙවුම් ශේෂයේ වෙළෙඳ භාණ්ඩ ගිණුමේ හිඟය 2023 වෂර්යේ දී 2010 වසරට පසු අඩුම මට්ටම කරා ළඟා විය. මෙසේ පහළ යැමට බලපෑ ප්‍රධාන හේතු වන්නේ,

(1)භාණ්ඩ අපනයන ආදායම පහළ යාමට සාපේක්ෂව ආනයන වියදම විශාල ලෙස අඩුවීම වේ.

(2) සංචාරක ඉපයීම් ඇතුළු සේවා වෙළෙඳාමේ වධර්නය හා ද්විතීක ආදායම් ගිණුමේ ඉහළ අතිරික්තය වේ.

(3)විදේශීය ජංගම ගිණුම 2022 පැවති හිඟයට සාපේක්ෂව අතිරික්තයක් වාතර්ා කිරීම වේ. .

(4) අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයනය පහළ යාම හා අපනයන ආදායම ඉතා ඉහළ අගයක් ගැනීම වේ.

(5) 2022 වසරේ සිට සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් අඛණ්ඩව වධර්නය වීම වේ.

(43) ආර්ථික වෘද්ධිය හා සම්බන්ධ ප්‍රකාශ කීපයක් පහත පරිදි වෙයි.

A මිල මට්ටම වැඩිවන වෙගයට වඩා වැඩි වේගයකින් වරතන මිලට දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාමකි.

B වතර්න මිලට දළ දේශීය නිෂ්පාදිතය වැඩිවන වෙගයට වඩා වැඩි වේගයකින් මිල මට්ටම ඉහළ යාමකි.

C නිෂ්පාදන ධාරිතාවයෙහි ප්‍රසාරණයකි.

D සමාහාර සැපයුම් වක්‍රය දකුණට විතැන්වීමකි.

E නිෂ්පාදන හැකියා මායිමේ පිටත තිබෙන භාණ්ඩ සංයෝගයක් අත්පත් කර ගැනීමකි.

ඉහත ප්‍රකාශයන් අතුරෙන් ආර්ථික වෘද්ධියට අදාළ ප්‍රකාශ පමණක් ඇතුළත් කාණ්ඩය වනුයේ,

(1) A, B, C (2) A, C , D (3) A, B, E (4) C, D, E (5) B, D, E

(44) ජනගහන ව්‍යාප්තියේ වයස් ව්‍යුහයේ ඇතිවන ,වයස් ගත ජනගහනය වැඩි වීම නිසා විවිධ දුෂ්කරතා වලට ආර්ථිකයන් මුහුණ දේ. එසේ නොවන අවස්ථාව හඳුනාගන්න.

(1) යැපුම් අනුපාතිකය ඉහළ යාම. (2) ශ්‍රම ඵලදායීතාවය පහළ යාම.

(3)අයවැය මත පීඩනය වැඩවීම. (5)ශ්‍රම බලකාය පහළ යාම.

(4) ළමා ජනගහනය පහළ යාම.

(45)ජන හා සංඛා ලේඛන දෙපාතර්මේන්තුවේ 2019 සමීක්ෂණය අනුව ශ්‍රී ලංකාවේ ඉහළම දරිද්‍රතා දශර්කය පෙනුනම් කරන අංශය , පළාත හා දිස්ත්‍රික්කය පිළිවෙලින්,

(1) වතු අංශය, ඌව පළාත හා මඩකලපුව වේ.

(2) නාගරික අංශය,නැගෙනහිර පළාත හා මුලතිව් වේ.

(3) වතු අංශය, ඌව පළාත හා මුලතිව් වේ.

(4) ග්‍රාමීය අංශය, ඌව පළාත හා කිළිනොච්චි වේ.

(5) ග්‍රාමීය අංශය, උතුරු පළාත හා මුලතිව් වේ.

(46)සමාජයේ සියළුම ආදායම් ලබන කුටුම්භ අතර සමානව ආදායම බෙදී ගොස් තිබේ නම් , ගිනි සංගුණකය හා ලෝරනස් වක්‍රය , පිළිබඳ පහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය වනුයේ කුමක් ද? ගිනි සංගුනකය හා ලෝරන්ස් වක්‍රය පිළිවෙලින්,

(1) ශුන්‍ය වන අතර $45^0$ රේඛාව මත පිහිටයි.

(2) 1 වන අතර දක්ණු පස තිරස් හා සිරස් අක්ෂ මත පිහිටයි.

(3) 1 වන අතර ලෝරන්ස් වක්‍රය $45^0$ රේඛාව මත පිහිටයි.

(4) ශුන්‍ය වන අතර දකුණු පස තිරස් හා සිරස් අක්ෂ මත පිහිටයි.

(5) ශුන්‍යට ආසන්න වන අතර සමව්‍යාප්ති රේඛාවට ආසන්නව පිහිටයි.

(47) 2022 දත්ත මත පදනම් රටවල් 193 ක් අතුරින් මානව සංවධර්න දශර්කය අනුව ලංකාවේ අගය සහ ශ්‍රී ලංකාවේ ස්ථානය පිළිවෙලිවන්

(1) 0.782 හා 73 (2) 0.780 හා 78 (3) 0.782 හා 78

(4) 0.780 හා 73 (5) 0.782 හා 72

(48) ආර්ථිකයක නවීකරණය වීමත් සමග ශ්‍රමිකයන්ගේ නිපුණතා හෝ හැකියාවන් සහ පවත්නා රකියාවන් අතර නොගැලපීම නිසා ඇතිවන සේවා වියුක්තිය වනුයේ,

(1) සාෂර්ක සේවා වියුක්තිය. (2) චක්‍රීය සේවා වියුක්තිය (3) සැඟවුණ සේවා වියුක්තිය

(4)අනිච්චානුගත සේවා වියුක්තිය (5) ව්‍යුහමය සේවා වියුකතිය.

(49) පහළම ආදායම් ලබන රටවල් හඳුනාගැනීම සඳහා ලෝක බැංකුව විසින් ප්‍රකාශිත **2023** ? ජුලි ලෝක සංවර්ධන වාර්තාව අනුව ප්‍රතිශීර්ෂ ආදායම් නිර්ණායකයන් වන්නේ, ඇමරිකන් ඩොලර් ,

(1) 1085 ට අඩු වීම. (2) 1135 ට අඩු වීම. (3) 4255 ට අඩුවීම

(4) 4465 ට අඩු වීම. (5) 13845 ට අඩුවීම.

(50) 2023 වර්ෂයේ ලංකාවේපවත්නා වෙළෙ පොල මිල අනුව දළ දේශීය නිෂ්පාදිතයට හා සේවා නියුක්තියට කෘෂිකාමරීක කාමරීක හා සේවා අංශයේ දායකත්වය ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින්,

(1) 8.3 , 25.6 , 59.9 හා 26.1, 25.5, 48.4

(2) 8.8 , 30,0 55.9 හා 24.8, 27.2 , 48.0

(3) 8.5, 26.6 , 54.6 හා 17.4 , 32.7 , 49.9

(4) 6.2, 26.3, 47.7 හා 16.5, 24.2 , 59.3

(5) 27.6 , 29.6, 42.8 හා 10.5, 26.8, 62.7

☸☸☸

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது /All Right Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

# අවසාන වාර පරීක්ෂණය- 2024

ශ්‍රේණිය / தரம் / Grade 13

(21) ආර්ථික විද්‍යාව- 11

කාලය / நேரம் / Time පැය 3

නම / பெயர் / Name ..........................................................

විභාග අංකය / சுட்டிலக்கம் / Exam No. ........................

**අමතර මිනිත්තු 10 ක කියවීම් කාලයක් ලැබෙන අතර එය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් ,පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදවන්න.**

**උපදෙස්;**

**❁" අ" උප කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද , "ආ " උප කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

**❁ අවශ්‍ය විටක ප්‍රස්ථාර කඩදාසි භාවිතා කරන්න.**

## "අ" උප කොටස

(1) (අ) (i) සම්පත් නොමැති රටක් ලෝකයේ නොමැත. එහෙත් සම්පත් හිගකමක් ඇතැයි ආර්ථික විද්‍යාවෙහි කිය වේ. මෙම ගැටළුව ඔබ හඳුනා ගන්නේ කෙසේ ද? (ල.2යි)

(ii) ආර්ථිකයක සම්පත් භාවිතයේදී අදාළ නිෂ්පාදන කාර්යක්ෂමතාවය රූපසටහනක් ඇසුරින් පැහැදිළි කරන්න. (ල.4යි)

(iii) රටක ව්‍යවසායකත්වය මානව ශ්‍රම සම්පතක් වුවත් එය සුවිශේෂී හැකියාවන්ගෙන් සමන්විත මිනිස් ශ්‍රමයකි. මෙම ප්‍රකාශය පැහැදිළ කරන්න. (ල.3යි)

(ආ) කිසියම් ආර්ථිකයක සිරස් අක්ෂයේ Y භාණ්ඩයත් තිරස් අක්ෂයේ X භාණ්ඩයත් දැක්වෙන සමජාතීය නොවන සම්පත් භාවිතයට ගෙන ගොඩ නගන ලද නිෂ්පාදන හැකියා ආදශර්යක් ඇසුරින් පහත සඳහන් සිදුවීම් පෙන්වන්න.

i ව්‍යාපාර චක්‍රයක (වෙළෙඳ චක්‍රයක) සිදුවන ප්‍රතිගමනයක ප්‍රතිඵලය

ii රටක නිෂ්පාදන ධාරිතාව ඉහළ යාමක දී ලැබෙන ප්‍රතිඵලය. (ල.2බැගින් 4 කි.)

(ඉ) i සම්පත් කාර්යක්ෂමව බෙදා හැරීමට මිල යන්ත්‍රණය අසමත් වේ යැයි පැවසීමට හේතු කවරේ ද? (ල.4යි)

ii සම්පත් බෙදාහැරීමේ යාන්ත්‍රණය මත ආර්ථික පද්ධති වගර් කරන්නේ කෙසේ ද? (ල.3යි)

(2) (අ) i ඉල්ලුම් න්‍යාය හා ඉල්ලුම් නීතිය පැහැදිළි කරන්න. (ල. 3යි )

ii සාමාන්‍ය භාණ්ඩයක හා බාල භාණ්ඩයක මිල වැඩිවීමකට අදාල ආදායම් ප්‍රතිවිපාකය පැහැදිළි කරන්න. (ල.4යි)

(ආ) තරඟකාරී වෙළෙඳ පොළක භාණ්ඩයක් සඳහා පහත තොරතුරු දැක්වේ.

| මිල | සැපයුම් ප්‍රමාණය | ඉල්ලුම් ප්‍රමාණය |
|---|---|---|
| 40 | 100 | 100 |

මිල රු.40දී , මෙම භාණ්ඩයේ ඉල්ලුම් නම්‍යතාවය - 2 වන අතර සැපයුම් නම්‍යතාවය 2 කි.

i මෙම භාණ්ඩයට අදාල ඉල්ලුම් හා සැපයුම් සමීකරණ සකසන්න. (ල.4යි)

iiභාණ්ඩ ඒකක 50 ට අදාළ අධි ඉල්ලුම් මිල කොපමණ ද? (ල.2යි)

iii සමතුලිතයේ දී පාරිභෝගික හා නිෂ්පාදක අතිරික්තය ගණනය කරන්න. (ල.2යි)

(ඉ)i ආදායම් ඉල්ලුම් නම්‍යතාවය හා හරස් ඉල්ලුම් නම්‍යතාවය අනුව භාණ්ඩ වගර් හඳුනාගන්නේ කෙසේ ද? (ල.3යි)

ii භාන්ඩ වල මිල වෙනස් වන විට, සැපයුම් කරුවන් දක්වන ප්‍රතිචාරය භාණ්ඩයකින් භාණ්ඩයකට වෙනස් වීමට බලපාන හේතු දෙකක් දක්වන්න. (ල.2යි)

(3)iරජය වෙළෙඳ පොළට මැදිහත් වන ප්‍රධාන ආකාර දක්වා බදු අය කිරීමේ ප්‍රධාන ස්වරූප දෙක නම් කරන්න. (ල.4යි)

ii උපරිම මිල පාලනය නිවර්චනය කර එය අපර්වත් කිරිම සඳහා යොදාගත හැකි ක්‍රියා මාගර් දක්වන්න. (ල.4යි)

iii පහත දැක්වෙන්නේ එක්තරා භාණ්ඩයකට අදාළ ඉල්ලුම් හා සැපයුම් සමීකරණයන් වේ.

$Qd = 500 - 10p$ $Qs = -100 + 10p$

මීට අදාළ ප්‍රස්තාර සටහන නිමර්ාණය කරමින්

(අ) වෙළෙඳ පොළ සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න. (ල.2යි)

(ආ) රජය මෙම භාන්ඩ ඒකකයක් මත රු. 10/= ක නිෂ්පාදන සහනාධාරයක් දෙනු ලබන්නේ නම්, ඒ සඳහා රජය දරන පිරිවැය කොපමණ ද? (ල.3)

(ඉ) සහනාධාරයෙන් පසු නිෂ්පාදන අතිරික්තය ගණනය කරන්න. (ල.2යි)

(ඊ) සහනාධාරය ලබාදීම නිසා ඇතිවන අහිමිවන සුභ සාධනය ගණනය කරන්න. (ල.2යි)

iv වෙළෙඳ පොලේ එළවළු මිල නිරන්තරයෙන් වෙනස් වේ. එයට බලපාන සාධක පැහැදිළි කරන්න. (ල.3)

(4) iඑලදා වක්‍ර උපයෝගී කර ගනිමින් හීනවන ආන්තික එලදා නීතිය පැහැදිළි කරන්න. (ල.4යි)

ii පහත සඳහන් පිරිවැය වගර් කෙටියෙන් පැහැදිළි කරන්න.

(අ) විචල්‍ය පිරිවැය (ආ) ගනකාධිකාරී පිරිවැය.

(ඉ) ආරෝපිත පිරිවැය (ඊ) සාමාන්‍ය ස්ථාවර පිරිවැය (ල.4යි)

iii පරිමාණානුකූල පිරිමැසුම් ඇතිවීම කෙරෙහි බලපාන කරුණු කවරේ ද? ( ල.4යි)

iv නිෂ්පාදන ආයතනයක , කෙටි කාලයේ දී ආයතනික සැපයුම් වක්‍රය හා වෙළෙඳ පොළ සැපයුම් වක්‍රය පැහැදිළි කරන්න. (ල.4යි)

v කතිපයාධිකාරී වෙළෙඳ පොළක "මිල දැඩියාව" පැහැදිළි කරන්න. (ල.4යි)

(5)i අගර්ීකය ප්‍රදේශය යන්න හඳුන්වා එහි ප්‍රධාන ආයතනික ඒකක දක්වන්න. (ල.4 යි.)

ii මූලික මිල , නිෂ්පාදකයාගේ මිල හා ගැනුම්කරුවන්ගේ මිල අතර වෙනස පැහැදිළි කරන්න. (ල. 3යි)

iii කල්පිත ආගර්ීකයක් සම්බන්ධ යෙන් දී ඇති , පහත දත්ත කෙරෙහි ඔබේ අවධානය යොමු කොට අදාළ දත්ත පමණක් උපයෝගී කර ගනිමින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු දෙන්න .

(දත්ත රු. මි. වලිනි)

| | |
|---|---|
| වෙළෙඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය | 180 |
| ශුද්ධ අපනයන | - 80 |
| විදේශ ශුද්ධ ප්‍රාථමික ගිණුමේ ශේෂය | - 20 |
| විදේශ ශුද්ධ ද්විතීක ආදායම් ගිණුම | 50 |
| රජයේ පරිභෝජනය | 20 |
| පෞද්ගලික පරිභෝජනය | 60 |

(අ) දේශීය ඉතුරුම් හා ජාතික ඉතුරුම් (ල.4යි)

(ආ) දළ දේශීය වියදම හා දළ ආයෝජනය (ල. 3 යි.)

iv ආන්තික පරිභෝජන නැමියාව හා සාමාන්‍ය පරිභෝජන නැමියාව යන්න පැහැදිළි කරන්න.(ල.2)

v C = 100 + 0.75yd I = 125 G = 60 T = 50 Tr = 10 X = 40 M = 10

ඉහත දත්ත උපයෝගී කර ගනිමින් මෙම ආර්ථිකයේ සමතුලිත නිමැවුම සොයන්න. එම අවස්ථාවේ විදීම් කාන්දුවීම් වලට සමාන බව පෙන්වන්න. (ල.4යි.)

## (ආ) කොටස

(6) i හොඳ මුදලක තිබිය යුතු ගුණාංග නම් කරන්න (ල.2 යි.)

ii ශ්‍රී ලංකා මහ බැංකුවට අනුව මූල්‍ය ආයතන නම් කරන්න. (ල.3යි.)

iii පහත දැක්වෙන්නේ එක්තරා වානිජ බැංකුවක ශේෂ පත්‍රයයි.

| වගකීම් | | වත්කම් | |
|---|---|---|---|
| ඉල්ලුම් තැන්පතු | 50000 | මුදල් සංචිතය<br>සුරැකුම් පත්<br>ණය | 7000<br>3000<br>40000 |
| | 50000 | | 50000 |

ව්‍යවස්ථා සංචිත අනුපාතිකය 10% ක් වේ.

i අධි සංචිත පවතීද?පිළිතුරට හේතු දක්වන්න. (ල.2යි.)

ii පුද්ගලයෙක් චෙක්පතක් මගින් රු. 1500 ක තැන්පත් මෙම බැංකුවෙන් ආපසු ලබා ගන්නා ලදී. මෙසේ තැන්පතුව ආපසු ගත් පසු බැංකුවේ නව ශේෂ පත්‍රය පිළියෙල කරන්න ( ල. 3 යි.)

iii තැන්පත් මුදල් ආපසු ලබා ගත් පසු බැංකුවේ සංචිතය පිළිබඳව ඔබට කුමක් කිව හැකිද ? (ල.2 යි.)

iv ශ්‍රී ලංකා මහ බැංකුව මෙම වර්ෂයේ දී නිත්‍ය තැන්පතු අනුපාතය හා නිත්‍ය ණය අනුපාතය පහත දමන ලදී. මෙම නිත්‍ය තැන්පතු අනුපාතය හා නිත්‍ය ණය අනුපාතය යන්න පැහැදිළි කරන්න.(ල.4යි)

v සුදුසු ප්‍රස්ථාර සටහන් උපයේගී කර ගනිමින් වතුකම්කරුවන්ගේ වැටුප් වැඩි කිරීම නිසා එය රටතුළ උද්ධමනයට බලපාන ආකාරය පැහැදිළි කරන්න (ල.4යි.)

(7) i බද්දක් පැනවීමේ දී තිබිය යුතු , ‘‘සාධාරණ බව’’ යන මූල ධමර්ය පැහැදිළි කරන්න. (ල.4 යි.)

ii රාජ්‍ය අයවැයෙහි වර්ථන වියදම් සංරචක නම් කරන්න. (ල.3 යි)

iii ශ්‍රී ලංකාවේ රාජ්‍ය අයවැය ලේඛනයේ වතර්න ගිණුමේ හිඟයක් පවතින අතර, එය දිගින් දිගටම පුළුල් වෙමින් පවතී. එසේනම්, වතර්න ගිණුමේ හිඟයක් යන්න පැහැදිළි කොට, එහි ප්‍රතිවිපාක සඳහන් කරන්න. (ල. 5යි)

iv අයවැය හිඟය පියවා ගැනීමේ ප්‍රසාරණාත්මක මූලයන් නම් කර එය පැහැදිළි කරන්න. (ල.4යි.)

v ශ්‍රී ලංකාව තුළ පවතින ආර්ථික අබර්ුදයත් සමග රාජ්‍ය ණය හා පොළී ආපසු ගෙවීම ගැටළුවක් වී ඇත. ඒ සඳහා වතර්මානයයේ ණය ප්‍රතිව්‍යුගත කිරීම පිළිබඳ අවධානය යොමුකර ඇත. එහි අරමුණු මොනවා ද? (ල.4යි.)

(8)i නිරපේක්ෂ වාසි න්‍යායේ හා සාපේක්ෂ වාසි න්‍යායේ පදනම කුමක් ද? (ල.2)

ii රටවල් දෙකක් සම්බන්ධයෙන් නිෂ්පාදන ඒකකයත් සඳහා වැයවන ශ්‍රම පැය ගණන පහත දක්වා ඇත.මෙම රටවල් දෙක සතුව ශ්‍රම පැය 120 ක් පවතී.

| | උතුරු රට | දකුණු රට |
|---|---|---|
| X භාණ්ඩය | 60 | 10 |
| Y භාණ්ඩය | 30 | 20 |

(අ) භාණ්ඩ දෙක සම්බන්ධයෙන් කායර්ක්ෂම රට කුමක් ද? (ල.2)

(ආ) එක් ඒක් රට විශේෂීකරණ භාණ්ඩ අනුව හුවමාරු අනුපාත පරාසය දක්වන්න.(ල.4)

(ඉ) රටවල් දෙකෙහි නිෂ්පාදන හැකියාව හා පරිභෝජන හැකියාව රූප සටහන් ඇසුරින් පෙන්වන්න. (රටවල් දෙකටම වඩාත් වාසිදායක හුවමාරු අනුපාතයට අඳින්න.1:1) (ල.4යි)

iii පහත සඳහන් සිදුවීම් විනිමය අනුපාතයට කරනු ලබන බලපෑම ,රුපියල් ඉල්ලුම් සැපයුම් වෙළෙඳ පොළට අදාළ රූප සටහන් මගින් පෙන්වන්න. (රූප සටහන් වෙන වෙනම අඳින්න)

(අ) ශ්‍රී ලංකා ආර්ථිකය මෝටර් රථ ආනයනය කිරීම වැඩි කිරීම.

(ආ)ඇමරික් එක්සත් ජනපදය මගින් ශ්‍රී ලංකාවේ ඇඟළුම් හා තේ මිලදී ගැනීම වැඩි කිරීම.

(ඉ) විදේශ සංචාරකයින් ලංකාවට පැමිණීම ඇඩි ලෙස ඉහළ යාම.

(ඊ) විදේශ රටවල ඉගෙනීම සඳහා ශ්‍රී ලාංකීය සිසුන් වැඩි වැඩියෙන් යොමුවීම.

(ල. 2 බැගින් මුළු ලකුණු 8 කි)

(9) i ආර්ථික වෘද්ධිය හා ආර්ථික වෘද්ධි අනුපාතිකය යන්න ඔබ පැහැදිළි කරන්නේ කෙසේ ද? (ල.4යි)

ii පංචමක අපකිරණ අනුපාතිකය යන්න පැහැදිළි කරන්න. (ල.3යි)

iii ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තිය හා ප්‍රජා විද්‍යාත්මක පාරිතෝෂිතය යන සංකල්ප පැහැදිළි කරන්න. (ල.4යි)

iv මානව සංවධර්න දශර්කය ගණනයට අදාළ, සංරචක දක්වා එම දශර්කයේ වාසි 2 ක් දක්වන්න. (ල.4යි)

v සමාජ ආරක්ෂණ ජාල යන්න , දරිද්‍රතාවය, අවධානම්කාරී තත්ත්වය , අසමානතාවය වැනි ගැටළු, ආමන්ත්‍රණය කිරීමට වඩාත් යෝග්‍ය මෙවලමක් ලෙස ඉහළ පිළි ගැනීමකට ලක්ව ඇත. සමාජ ආරක්ෂණ ජාල යන්න අර්ථ දක්වා ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාතමක සමාජ ආරක්ෂණ ජාල වැඩ සටහන් දක්වන්න. (ල.5යි)

(10) i සිව්වන කාමරීක විප්ලවය (4IR) යනුවෙන් කුමක් අදහස් වේ ද? ශ්‍රී ලංකාව පසුවනුයේ කීවෙනි කාමරීක විප්ලවයේ ද? (ල.4යි.)

ii නිදහසින් පසු කාලයක් තිස්සේ ශ්‍රී ලංකාවට ඉහළ ආර්ථික වෘද්ධි අනුපාතිකයක් පවත්වා ගැනීමට අපොහොසත් වූ සාධකයන් කවරේ ද? (ල.4යි.)

iii ශ්‍රී ලංකාව, ආසියාවේ ප්‍රධානම සංචාරක මධ්‍යස්ථානයක් ලෙස පත් කර ගැනීමේ දී මුහුණ දෙන අභියෝගයන් කවරේ ද? (ල.4යි.) ල. 2x 4 )

iv පහත සඳහන් ගෝලීය දශර්ක අනුව ශ්‍රී ලංකාවේ වතර්මාන තත්ත්වය කුමක් ද?(ල.8 යි)

(අ) ව්‍යාපාර පවත්වා ගෙන යාමේ පහසුව පිළිබඳ දශර්කය
Ease of doing Business Index

(ආ) ගෝලීය තරඟකාරිත්ව දශර්කය.
Globle Competitivenes Index

(ඉ) දූෂණ සංජානන දශර්කය.
Corruption perception Index

(ඊ) ගෝලීය සන්තුෂ්ඨික දශර්කය
Globle Happeness Index

☸☸☸

දකුණු පළාත .උසස් පෙළ සාධන මට්ටම වැඩි කිරීමේ වැඩ සටහන

2024 - 13 වසර අවසාන පෙර හුරු පරීක්ෂණය

ආර්ථික විද්‍යාව - පිළිතුරු පත්‍රය

## "අ" උප කොටස

(1) (අ) (i) සම්පත් නොමැති රටක් ලෝකයේ නොමැත. එහෙත් සම්පත් හිගකමක් ඇතැයි ආර්ථික විද්‍යාවෙහි කිය වේ. මෙම ගැටළුව ඔබ හඳුනා ගන්නේ කෙසේ ද? (ල.2යි)

ඕනෑම රටක නිරපේකෂ වශයෙන් බලන විට සම්පත් ඇත. එහෙත් මිනිසාගේ අසීමිත වුවමනා වලට සාපේක්ෂව බලන විට ඒවා සියල්ලම ඉටු කර ගැනීමට තරම් ප්‍රමාණවත් සම්පත් නොමැතිවීම ආර්ථික විද්‍යාවේ සම්පත් හිගකම ලෙස සළකයි. (ල.2යි)

(ii) ආර්ථිකයක සම්පත් භාවිතයේදී අදාළ නිෂ්පාදන කායර්ක්ෂමතාවය රූපසටහනක් ඇසුරින් පැහැදිළි කරන්න. (ල.4යි)


"නිෂ්පාදන කායර්ක්ෂමතාවය" යනු, අවම යෙදවුම් පිරිවැයක් තුළ අදාළ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමයි. (එනම් දෙන ලද යෙදවුම් ප්‍රමානයකින් උපරිම නිමැවුමක් ලබා ගැනීම හෝ දෙන ලද නිමැවුමක් අවම යෙදවුම් ්රමාණයකින් නිපදවීමයි.) (ල.1යි)

එයට විකල්ප පිළිතුර

ආර්ථිකයකට වෙනත් භාණ්ඩයක නිමැවුම වැඩි කර ගත නොහැකි තත්ත්වයක් පැවතීමයි.

නිෂ්පාදන හැකියා මායිම මත ඕනෑම ලක්ෂ්‍යයක නිෂ්පාදන කායර්ක්ෂමතාවය පිළිබිඹු කරන අතර අවශ්‍ය කොන්දේසි දෙක වනුයේ,

- පූණර් නිෂ්පාදනය - පූණර් සේවා නියුක්තියයි. (ල.2යි)
- 




නිෂ්පාදන හැකියා මායිම මත ඕනෑම ලක්ෂ්‍යයක නිෂ්පාදන කායර්ක්ෂමතාවය පිළිබිඹු කරයි. (රූප සටහනට ලකුණු 1 යි.)

(iii) රටක ව්‍යවසායකත්වය මානව ශ්‍රම සම්පතක් වුවත් එය සුවිශේෂී හැකියාවන්ගෙන් සමන්විත මිනිස් ශ්‍රමයකි. මෙම ප්‍රකාශය පැහැදිළ කරන්න. (ල.3යි)


ව්‍යවසායකත්වය මානව සම්පතක් වුව ද සෑම ශ්‍රමිකයෙකුටම ව්‍යවසායකයකු වීම අපහසුය. ව්‍යවසායකයා සතුව විශේෂිත හැකියාවන් තිබිය යුතුය. එනම්,

- නිෂ්පාදන තීරණ ගැනීම තුලින් ව්‍යාපාරික අවස්ථා හඳුනා ගැනීම.
- අනෙකුත් සාධක මනා ලෙස සංයෝග කරමින් නිෂ්පාදන කටයුතු සංවිධානය කිරීම.
- නව්‍යතා වානිජ පදනමකින් වෙළෙඳ පොළට හඳුන්වා දීම.
- ඉහත කායර්යන් ඉටු කිරීමේ දී අවධානම් වලට සාථර්කව මුහුණ දීම.

මෙවැනි සුවිශේෂී හේතු අවශ්‍ය නිසා එය ශ්‍රමයෙන් වෙනස් වේ. (ල. 3යි)

(ආ) කිසියම් ආථර්කයක සිරස් අක්ෂයේ Y භාණ්ඩයත් තිරස් අක්ෂයේ X භාණ්ඩයත් දැක්වෙන සමජාතීය නොවන සම්පත් භාවිතයට ගෙන ගොඩ නගන ලද නිෂ්පාදන හැකියා ආදශර්යක් ඇසුරින් පහත සඳහන් සිදුවීම් පෙන්වන්න.


(1) ව්‍යාපාර චක්‍රයක (වෙළෙඳ චක්‍රයක) සිදුවන ප්‍රතිගමනයක ප්‍රතිඵලය




ව්‍යාපාර චක්‍රයක ප්‍රතිගමනයක ප්‍රතිඵලය වනුයේ, නි.හැ.මායිමේ සිට හෝ මායිම ඇතුලත සංයෝගයක සිට ඇතුලත අඩු භාණ්ඩ සංයෝගයක් කරා නිෂ්පාදන සංයෝගය මාරු වීමයිත

(රූප සටහන පමණක් තිබුණ ද ල. 2යි)

(2) රටක නිෂ්පාදන ධාරිතාව ඉහළ යාමක දී ලැබෙන ප්‍රතිඵලය. (ල.2බැගින් 4 කි.)




නිෂ්පාදන ධාරිතාවය ඉහළ යාමක දී **නිෂ්පාදන හැකියාව ඉහළ යන බැවින් නි.හැ. මායිම දකුණට විතැනුවීමක් සිදු වේ.**

(රූප සටහන පමණක් තිබුණ ද ල. 2යි)

(ඉ) i සම්පත් කායර්ක්ෂමව බෙදා හැරීමට මිල යන්ත්‍රණය අසමත් වේ යැයි පැවසීමට හේතු කවරේ ද? (ල.4යි)

සම්පත් කායර්ක්ෂම ලෙස බෙදා හැරීමට මිල යන්ත්‍රණය අසමත් වන්නේ පහත සඳහන් හේතු නිසාය.

- පොදු භාණ්ඩ නොසැපයීම.
- බාහිරතා සැළකිල්ලට නොගැනීම.
- පොදු සම්පත් අධි උපයෝජනයට ලක්වීම.
- වෙළෙඳ පොළ බලය (ඒකාධිකාරීබලපෑම්)
- සාධක අසංචලතාවය
- තොරතුරු පූණර් ලෙස ගලා නොයාම.
- ආදායම් බෙදී යාමේ විසමතා පැවතීම.
- ඇතැම් ගණුදෙනු වලට වෙළෙඳපොලවල් නොතිබීම.

( එක කරුණකට ලකුණු 1 බැගින් මුළු ලකුණු 4 යි.

ii සම්පත් බෙදාහැරීමේ යාන්ත්‍රණය මත ආර්ථික පද්ධති වගර් කරන්නේ කෙසේ ද? (ල.3යි)

සම්පත් බෙදා හැරීමේ යාන්ත්‍රණය මත ආර්ථික පද්ධති තුනක් දැක්වේ.

- වෙළෙඳ පොළ ආර්ථික පද්ධතිය (මිල යන්ත්‍රණය)
- විධාන / සැළසුම් ගත පද්ධති ( සැළසුම් යාන්ත්‍රණය)
- සම්ප්‍රධායික ආර්ථික පද්ධති (සිරිත් විරිත් හා සම්ප්‍රධායන් මත සම්ප්‍රධායික ආර්ථික පද්ධතිය වෙනුවට මිශ්‍ර ආර්ථික පද්ධතිය ලියා තිබේ නම් එයට ද ලකුණු දෙන්න) (එක් ආර්ථික පද්ධථියකට එක ලකුණ බැගින් ලකුනු 3 කි)

(2) (අ) i ඉල්ලුම් න්‍යාය හා ඉල්ලුම් නීතිය පැහැදිළි කරන්න. (ල. 3යි )

ඉල්ලුම් න්‍යාය මගින් භාණ්‍ඩයක වෙළෙඳ පොළ ඉල්ලුමත් එයට බලපාන සියළුම සාධකත් අතර පවතින් විවිධ සම්බන්ධතා විග්‍රයහට ලක්වෙයි. එම නිසා එය පුළුල් සංකල්පයකි. ඉල්ලුම් නීතිය ද ඒයට අයත් වෙයි. (ල.2)

එහෙත් ඉල්ලුම් නීතිය යනු, යම් දෙන ලද අවස්ථාවක අනෙකුත් සාධක ස්ථාවරව තිබිය දී සළකා බලන භාණ්ඩයේ මිලත් ඉල්ලුම් ප්‍රමානයත් අතර පවතින ප්‍රතිලෝම හෙවත් සෘණ සම්බන්ධතාවයයි. (ල.1 යි.)

ii සාමාන්‍ය භාණ්ඩයක හා බාල භාණ්ඩයක මිල වැඩිවීමකට අදාල ආදායම් ප්‍රතිවිපාකය පැහැදිළි කරන්න. (ල.4යි)

සාමාන්‍ය භාණ්ඩයක මිල වැඩි වීමක දී පාරිබෝගික මුදල් ආදායමේ ක්‍රය ශක්තිය හෙවත් මූතර් ආදායම අඩුවන නිසා ඉල්ලුම් ප්‍රමාණයත් අඩු වෙයි. නැතිනම් ආදායම් ප්‍රතිවිපාකය ධන වෙයි. (ලකුණු 2 යි.)

එහෙත් බාල භාණ්‍ඩයක මිල වැඩවන විට මූතර් ආදායම අඩුවුවත් ඉල්ලුම් ප්‍රමාණය වැඩි වෙයි. එහි බලපෑම එතරම් බලවත් නොවෙයි. නමුත් අදාල භාණ්ඩ වල ආදායම් ප්‍රතිවිපාකය සෘණ වෙයි. (ලකුණු 2 යි.)

(ආ) තරඟකාරී වෙළෙඳ පොළක භාණ්ඩයක් සඳහා පහත තොරතුරු දැක්වේ.

| මිල | සැපයුම් ප්‍රමාණය | ඉල්ලුම් ප්‍රමාණය |
|---|---|---|
| 40 | 100 | 100 |

මිල රු.40දී , මෙම භාණ්ඩයේ ඉල්ලුම් නම්‍යතාවය - 2 වන අතර සැපයුම් නම්‍යතාවය 2 කි.

i මෙම භාණ්ඩයට අදාල ඉල්ලුම් හා සැපයුම් සමීකරණ සකසන්න. (ල.4යි)

Qd = a – bp

100 = a - 5 x 40

100 = a – 200

100 + 200 = a

300 = a

**Qd = 300 – 5p** (ල.2යි)

**Qs = a +bp**

$\frac{\Delta Q}{\Delta P} x \frac{p}{Q}$ =Edp $\frac{\Delta Q}{\Delta P} x \frac{40}{100}$ = -2

$\frac{\Delta Q}{\Delta P} = \frac{10}{4}$ x -2 = $\frac{\Delta Q}{\Delta P} = -5$

$\frac{\Delta Q}{\Delta P} x \frac{p}{Q}$ =Esp $\frac{\Delta Q}{\Delta P} x \frac{40}{100}$ = 2

$\frac{\Delta Q}{\Delta P} = \frac{10}{4}$ x 2 = $\frac{\Delta Q}{\Delta P} = 5$

100 = a + 5 x 40 = 100 = a + 200

100 - 200 = = -100 = a

**Qs = -100 +5p** (ල.2යි)

iiභාණ්ඩ ඒකක 50 ට අදාළ අධි ඉල්ලුම් මිල කොපමණ ද? (ල.2යි)

| 50 දී ඉල්ලුම | 50 දී සැපයුම |
|---|---|
| Qd = 300 – 5p | Qs= -100 + 5p |
| 50 = 300 – 5p | 50 = -100 + 5p |
| 50- 300 = -5p | 50 + 100 = -5p |
| -250/-5 = p | 150/-5 = p |
| 50 =p | 30 =p (ඉල්ලුම් මිල හා සැපයුම් මිල සෙවීමට ල.1යි) |

**අධි ඉල්ලුම් මිල = ඉල්ලුම් මිල - සැපයුම් මිල**

**= 50 – 30 =රු. 20 (ලකුණු 1 යි.)**

iii සමතුලිතයේ දී පාරිභෝගික හා නිෂ්පාදක අතිරික්තය ගණනය කරන්න. (ල.2යි)

**සමතුලිත මිල රු. 40 සමතුලිත ප්‍රමාණය ඒකක 100 නිසා**

**සමතුලිත මිලේ දී පාරිභෝගික අතිරික්තය**

**= (උපරිම ඉල්ලුම් මිල - සමතුලිත මිල ) x සමතුලිත ප්‍රමාණය/2**

**= (60 – 40 ) x 100/2**

**= 20 x 50 = රු.1000**

**(අදාළ ඉලක්කම් සහිතව ලබා ගන්නා පිළිතුරට ල.1 යි)**

**සමතුලිත මිලේ නිෂ්පාදක අතිරික්තය**

**= (සමතුලිත මිල - අවම සැපයුම් මිල) x සමතුලිත ප්‍රමාණය / 2**

**= (40 – 20 ) x 100/2**

**= 20 x 50 = රු.1000**

**(මුළු අයභාරය - මුළු විචල්‍ය පිරිවැය = නිෂ්පාදන අතිරික්තය ලෙස ද නිස්පාදන අතිරික්තය ලබා ගත හැකිය)**

**(අදාළ ඉලක්කම් සහිතව ලබා ගන්නා පිළිතුරට ල.1 යි)**

(ඉ)i ආදායම් ඉල්ලුම් නම්‍යතාවය හා හරස් ඉල්ලුම් නම්‍යතාවය අනුව භාණ්ඩ වගර් හඳුනාගන්නේ කෙසේ ද? (ල.3යි)

ආදායම් ඉල්ලුම් නම්‍යතාවය අනුව භාණ්ඩ හඳුනා ගන්ෙන්,

- ආදායම් ඉල්ලුම් නම්‍යතා සංගුණකය ධන සහ එකට වැඩි නම් සුඛෝපභෝගී භාණ්ඩ.
- ආදායම් ඉල්ලුම් නම්‍යතා සංගුණකය ධන සහ එකට අඩු නම් අත්‍යවශ්‍ය භාණ්ඩ
- ආදායම් ඉල්ලුම් නම්‍යතා සංගුණකය ඍන නම් බාල භාණ්ඩ.

( පිළිතුරු දෙකකට ලකුණු 1 යි.)

- හරස් ඉල්ලුම් නම්‍යතාවය අනුව භාණ්ඩ හඳුනා ගන්නේ

  හරස් ඉල්ලුම් නම්‍යතා සංගුණකය ධන( + ) නම් ආදේශණ භාණ්ඩ

  හරස් ඉල්ලුම් නම්‍යතා සංගුණකය ඍන( - ) නම් අනුපූරක භාණ්ඩ

  හරස් ඉල්ලුම් නම්‍යතා සංගුණකය ශූන්‍ය (0) සම්බන්ධයක් නොමැති භාණ්ඩ

  (කරුණු 3 ටම ලකුණු 2 කි.)

ii භාන්ඩ වල මිල වෙනස් වන විට, සැපයුම් කරුවන් දක්වන ප්‍රතිචාරය භාණ්ඩයකින් භාණ්ඩයකට වෙනස් වීමට බලපාන හේතු දෙකක් දක්වන්න. (ල.2යි)

- කමර්ාන්ත අතර සම්පත් සංචලනය කිරීමේ හැකියාව.
- මිල වෙනස්වීමෙන් පසු ගත වන කාලය.
- කමර්ාන්ත ධාරිතාවය උපයෝජනය වී තිබෙන ආකාරය
- භාණ් තොග පවත්ගෙන යාමේ හැකියාව.
- නිෂ්පාදන කටයුතු වලට යොදා ගනු ලබන යෙදවුම් ප්‍රමාණය
- භාණ්ඩයේ ස්වභාවය

(3)iරජය වෙළෙඳ පොළට මැදිහත් වන ප්‍රධාන ආකාර දක්වා බදු අය කිරීමේ ප්‍රධාන ස්වරූප දෙක නම් කරන්න. (ල.4යි)

1. බදු පැනවීම. 2. සහනාධාර ලබාදීම . 3. මිල පාලනය

4.මිල ස්ථායීකරණය. (ලකුණු 2 යි)

නිෂ්පාදනය හෝ පරිභෝජනය කරන නිශ්චිත ඒකකයක් මත නිශ්චිත රුපියල් ප්‍රමාණයක බදු අය කිරීම , හෝ භාණ්ඩයේ වටිනාකම මත කිසියම් ප්‍රතිශතයක් බදු වශයෙන් අයකිරීමයි. (ලකුණු 2 යි.)

විකල්ප පිළිතුර , නිශ්චිත බදු හෙවත් ඒකක බදු හා ප්‍රතිශතක බදු.

ii උපරිම මිල පාලනය නිවර්චනය කර එය අථර්වත් කිරීම සඳහා යොදාගත හැකි ක්‍රියා මාගර් දක්වන්න. (ල.4යි)

වෙළෙඳ පොළ බලවේග මත තීරණය වූ සමතුලිත මිල පාරිභෝගිකයාට අවාසි වූ අවස්ථාවක රජය විසින් සමතුලිත මිලට පහළ කෘතිම මිලක් පැනවීම උපරිම මිල පාලනය වේ. (ල.2යි)

- ආනයනය - නිෂ්පාදකයන් දිරිගැන්වීම - සළාකනය


  (ඕනෑම කරුණු දෙකකට ලකුණු 2 කි.)

iii පහත දැක්වෙන්නේ එක්තරා භාණ්ඩයකට අදාළ ඉල්ලුම් හා සැපයුම් සමීකරණයන් වේ.

$Qd = 500 - 10p \qquad Qs = -100 + 10p$

මීට අදාළ ප්‍රස්තාර සටහන නිමර්ාණය කරමින්

(අ) වෙළෙඳ පොළ සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න. (ල.2යි)




සමතුලිත මිල රු. 30/= ප්‍රමාණය ඒකක 200 කි.
(නිවැරදි රූප සටහනට හා සමතුලිතයට ලකුණු 2 කි)

(ආ) රජය මෙම භාන්ඩ ඒකකයක් මත රු. 10/= ක නිෂ්පාදන සහනාධාරයක් දෙනු ලබන්නේ නම්, ඒ සදහා රජය දරන වියදම කොපමණ ද? (ල.2)

10 x 250 = 2500 (ලකුණු 2කි.)

(ඉ) සහනාධාරයෙන් පසු නිෂ්පාදන අතිරික්තය ගණනය කරන්න. (ල.2යි)

( 35 - 10 ) x 250 /2 = 25 x 125 = 3125 (ක්‍රමයට ල.1යි.පිළිතුරට 1යි.)

(ඊ) සහනාධාරය ලබාදීම නිසා ඇතිවන සුභසාධන ප්‍රතිවිපාකය ගණනය කරන්න. (ල.2යි)


10 x 50 /2 = 10 x 25 = රු.250 (ක්‍රමයට ල.1යි.පිළිතුරට 1යි.)

iv වෙළෙඳ පොලේ එළවළු මිල නිරන්තරයෙන් වෙනස් වේ. එයට බලපාන සාධක පැහැදිළි කරන්න. (ල.4)

- එළවළු සඳහා අනම්‍ය ඉල්ලුමක් හා අනම්‍ය සැපයුමක් තිබීම.
- එළවළු වගා කිරීමට සැළසුම් කරන විට වෙළෙඳ පොලේ පවතින මිල හා, සැපයුම වෙළෙඳ පොළට පැමිණෙන විට පවතින මිල අතර වෙනස්කම් පැවතීම.

(එක් කරුණකට ලකුණු 2 බැගින් ලකුණු 4 කි.)

(4) iඑලදා වක්‍ර උපයෝගී කර ගනිමින් හීනවන ආන්තික ඵලදා නීතිය පැහැදිළි කරන්න. (ල.4යි)




(නිවැරදි රූප සටහනට ලකුණු 2 කි)

කෙටි කාලයේ දී කිසියම් සාධක ප්‍රමාණයක් ස්ථාවරව තබා ගනිමින් විචල්‍ය සාධක වැඩි කිරීමේ දී කිසියම් අවස්ථාවකින් පසු සාමාන්‍ය ඵලදාව හා ආන්තික ඵලදාව පහත වැටේ. (ල.2 යි.)

ii පහත සඳහන් පිරිවැය වගර් කෙටියෙන් පැහැදිළි කරන්න.

(අ) විචල්‍ය පිරිවැය (ආ) ගනකාධිකාරී පිරිවැය.

(ඉ) ආරෝපිත පිරිවැය (ඊ) සාමාන්‍ය ස්ථාවර පිරිවැය (ල.4යි)

විචල්‍ය පිරිවැය (ල.1යි.)

භාණ්ඩ නිෂ්පාදනය ආරම්භයත් සමග දැරීමට සිදුවන , විදුලිය, අමු ද්‍රව්‍ය, ශ්‍රමය, වැනි විචල්‍ය සාධක වෙනුවෙන් දරණ පිරිවැය විචල්‍ය පිරිවැය වේ. නිමැවුම ශූන්‍ය අවස්ථාවේ විචල්‍ය පිරිවැය ද ශූන්‍ය වන අතර, නිමැවුම සමග විචල්‍ය පිරිවැය වැඩි වේ.

ගනකාධිකාරී පිරිවැය. (ල.1යි.)

නිෂ්පාදනයේදී පිටතින් මිල දී ගන්නා යෙදවුම් වෙනුවෙන් දරණ පිරිවැය ගිණුමකරන පිරිවැය වේ.

ආරෝපිත පිරිවැය (ල.1යි.)

නිෂ්පාදන ක්‍රියාවලිය තුල දී ආයතනය සතු නිෂ්පාදන සම්පත් තම නිෂ්පාදනයට යෙදවීම නිසා වෙනත් විකල්ප අවස්ථාවන් වල යෙදවීමෙන් ලැබීමට තිබි ආදායම අහිමි වේ. එම අහිමි අවස්ථාවල වටිනාකම ආරෝපිත පිරිවැයකි.උදා:- අහිමි වැටුප්, බදුකුලී , පොලී හා ප්‍රාමාණික ලාභය .

සාමාන්‍ය ස්ථාවර පිරිවැය (ල.1යි.)

නිෂ්පාදන ඒකකයක් තුළ අන්තගර්ත ස්ථාවර පිරිවැය වේ. නිමැවුම වැඩි වන විට, සාමාන්‍ය ස්ථාවර පිරිවැය ක්‍රමයෙන් අඩු වේ.


iii පරිමාණානුකුල පිරිමැසුම් ඇතිවීම කෙරෙහි බලපාන කරුණු කවරේ ද? ( ල.4යි)

- තාක්ෂණික පිරිමැසුම්
- කළමණාකරන පිරිමැසුම්
- අළෙවිකරණ පිරිමැසුම්
- මූල්‍ය පිරිමැසුම්
- අවධානම් දැරීම සම්බනධ පිරිමැසුම්) (ල.1බැගින් මුළු ලකුණු 4 කි).)


iv නිෂ්පාදන ආයතනයක , කෙටි කාලයේ දී ආයතනික සැපයුම් වක්‍රය හා වෙළෙඳ පොළ සැපුය්ම් වක්‍රය පැහැදිළි කරන්න. (ල.4යි)

කෙටි කාලයේ දී ආයතනක් වසා දැමීම සිදු කරන්නේ, සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයේ අවම ලක්ෂ්‍යයට වඩා පහළ මිලක් තීරණය වූ විටදීය. AVC වක්‍රයේ අවම ලක්ෂ්‍යයේ සිට, ඉහළට ගමන් කරන ආන්තික පිරිවැය වක්‍රය ආයතනික සැපයුම් වක්‍රය වේ. (ල.1)

එවැනි එක් ඒක් ආයතන වල සැපයුම් වක්‍ර හෙවත් ආන්තික පිරිවැය වක්‍ර වල එකතුවෙන් වෙළෙඳ පොළ සැපයුම් වක්‍රය ගොඩ නැංවේ.(ල. 1)




(ල.1)




(ල.1)

v කතිපයාධිකාරී වෙළෙඳ පොළක "මිල දැඩියාව" පැහැදිළි කරන්න. (ල.4යි)

කතිපයාධිකාරී වෙළෙඳ පොළක ආයතන අතර තියුණු තරඟයක් පවතී. ඒ නිසා එක් ඒක් ආයතනයන් මිල වෙනස් කළ විට ක්ෂණිකව අනෙකුත් ආයතන ද ප්‍රතිචාර දකවයි.ඒවිට මිල වෙනස් කිරීමේ ප්‍රතිලාබ අත් නොවේ.ඒ නිසා වෙළෙඳ පොලේ තීරණය වන මිල ඉතා දිගු කාලයක් පවත්වගෙන යෑම මිල දැඩියාවයි. (ල.4 යි)

(5)i ආර්ථික ප්‍රදේශය යන්න හඳුන්වා එහි ප්‍රධාන ආයතනික ඒකක දක්වන්න. (ල.4 යි.)

තනි ආණ්ඩුවකට, සඵල ආර්ථික පාලනයට නතු වූ පුද්ගලයන්ට, භාණ්ඩ වලට සහ ප්‍රාග්ධනයට නිදහසේ සංචල විය හැකි , භූගෝලීය ප්‍රදේශය ආර්ථික ප්‍රදේශය ලෙස දැක්විය හැකිය (ල.1)

ආර්ථික ප්‍රදේශයට අයත් සංරචක නම්

- භූමි පුදේශය
- ජාතික ගුවන් අවකාශය
- ෙද්ශාන්ත මුහුදු සීමාව
- සළකා බලන රටට හිමි ලෝකයේ අනු රටවල පිහිටි පරිවාර ප්‍රදේශ

(කරුණු 4 ම ඇත්නම් ලකුණු 1 කි)

ආර්ථික ප්‍රදේශය තුළ ආර්ථික ක්‍රියාකාරකම් වල යෙදී සිටින ඒකක පස් වගර්යකි. (ල.1)

1. මූල්‍ය නොවන සමාගම්.
2. මූල්‍ය සමාගම්
3. රජය
4. කුටුම්භ
5. කුටුම්භ සඳහා සේවා සපයන ලාභ අපේක්සාවක් නොමැති ආයතන. (ල.1)

ii මූලික මිල , නිෂ්පාදකයාගේ මිල හා ගැනුම්කරුවන්ගේ මිල අතර වෙනස පැහැදිළි කරන්න. (ල. 4 යි)

- මූලික මිල යනු,නිෂ්පාදකයා තම භාණ්ඩය හෝ සේවාව හෝ නිෂ්පාදනය කොට අළෙවි කිරීමට සූදානම් කොට ඇති අවස්ථාවේ දී එම භාණ්ඩය හෝ සේවාව

සඳහා අදාළ මිල වේ. මෙහි නිෂ්පාදනය මත වෙනත් ශුද්ධ බදු ඇතුළත් වේ. (නිෂ්පාදිතය මත ශුද්ධ බදු ඇතුළත් නොවේ.)(ල.1)

- නිෂ්පාදකයාගේ මිල යනු, නිෂ්පාදන ස්ථානයෙන් වෙළෙඳුන් කරා භාණ්ඩය ඉවතට යන විට නිෂපාදකයා විසින් අයකරනු ලබන මිල වේ. මූලික මිල හා නිෂ්පාදකයාගේ මිල අතර වෙනස වන්නේ, නිෂ්පාදකයා මත බදු හා සහනාධාර වේ. (ල.1යි)
- ගැණුම්කරුවාගේ මිල යනු, සත්‍ය වශයෙන්ම භාණ්ඩ හා සේවා සඳහා ගෙවන මිල වේ. නැතිනම් වෙළෙඳ පොළ මිල වේ. (ල.1යි)
- නිෂ්පාදකයා ගේ මිල හා ගැණුම්කරුවාගේ මිල අතර වෙනස වන්නේ, පාරිභෝගිකයා මත බදු හා සහනාධාර, ප්‍රවාහන වියදම් හා වෙළෙඳ ආන්තික වේ. (ල.1යි)

iii කල්පිත ආර්ථිකයක 2023 සම්බන්ධ යෙන් දී ඇති , පහත දත්ත කෙරෙහි ඔබේ අවධානය යොමු කොට අදාළ දත්ත පමණක් උපයෝගී කර ගනිමින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු දෙන්න . (දත්ත රු. මි. වලිනි)

| | |
|---|---|
| වෙළෙඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය | 180 |
| ශුද්ධ අපනයන | - 80 |
| විදේශ ශුද්ධ ප්‍රාථමික ගිණුමේ ශේෂය | - 20 |
| විදේශ ශුද්ධ ද්විතීක ආදායම් ගිණුම | 50 |
| රජයේ පරිභෝජනය | 20 |
| පෞද්ගලික පරිභෝජනය | 60 |

(අ) දේශීය ඉතුරුම් හා ජාතික ඉතුරුම් (ල.2යි)

දේශීය ඉතුරුම් , = දළ දේශීය නිෂ්පාදිතය - කුටුම්භ හා රජයේ පරිභෝජනය

180 – ( 20 + 60) = 100 **( ක්‍රමයට ල.1යි.පිළිතුරට ල.1යි)**

ජාතික ඉතුරුම් = වැකළ හැකි ජාතික ආදායම - කුටුම්භ හා රජයේ පරිභෝජනය

(180 + (-20) + 50 ) = (60 + 20)

210 - 80 = 130 **( ක්‍රමයට ල.1යි.පිළිතුරට ල.1යි)**

නිවැරදි වෙනත් විකල්ප ක්‍රම භාවිතා කොට ඇත්නකම් ලකුණු ලබා දෙන්න.)

(ආ) දළ දේශීය වියදම හා දළ ආයෝජනය (ල. 4 යි)

දළ දේශීය වියදම = දළ දේශීය නිෂ්පාදිතය - ශුද්ධ අපනයන

= 180 – (-80) = 180 + 80 = 260 (ල.2යි)

දළ ආයෝජනය = දළ දේශීය වියදම - කුටුම්භ හා රජයේ පරිභෝජන වියදම්

= 260 - (20 + 60) = 260 – 80

= 180 (ල.2යි)

iv ආන්තික පරිභෝජන නැම්යාව හා සාමාන්‍ය පරිභෝජන නැම්යාව යන්න පැහැදිළි කරන්න. (ල.2)

ආන්තික පරිභෝජන නැම්යාව යනු, වැය කළ හැකි ආදායමේ වෙනස්වීමකට පරිභෝජනය දක්වන්නා ප්‍රතිචාරයේ තරමයි. $(\frac{\Delta C}{\Delta Yd})$ (ලකුණු 1යි)

වැය කළ හැකි ආදායමින් කොපමණ පරිභෝජනය කරන්නේ ද යන්න සාමාන්‍ය පරිභජන නැමියාවෙන් $(\frac{C}{Yd})$ සළකා බැලේ (ලකුණු 1 යි.)

v C = 100 + 0.75yd I = 125 G = 60 T = 50 Tr = 10 X = 40 M = 10

ඉහත දත්ත උපයෝගී කර ගනිමින් මෙම ආර්ථිකයේ සමතුලිත නිමැවුම හා එම අවස්ථාවේ විදීම් කාන්දුවීම් වලට සමාන බව පෙන්වන්න. (ල.4.)

Y = C + I + G + (X-M)

= 100 + 0.75 (Y – 50 + 10) + 125 + 60 + (40 – 10) (ල.1යි)

=285 + 0.75 (Y- 40) + 30

= 315 + o.75y – 30

Y – 0.75Y = 285

0.25Y = 285

Y = 285/ 0.75 = 28500/75 = 380 (ල.1යි)

S = -100 + 0.25Yd

S = -100 + (0.25 (1140 – 50 +10)

=-100 + 0.25y(1100)

= -100 + 275

W = J

S + T + M = I + G + X

175 + 40+ 10 = 125+ 60 +40 (ල.1)

225 = 225 (ල.1)

## (ආ) කොටස

(6) i හොඳ මුදලක තිබිය යුතු ගුණාංග නම් කරන්න (ල.2 යි.)

පොදු පිළි ගැනීම , රැගෙන යෑමේ පහසුව, ඉක්මණින් නශාා නොවීම, අනුකරණ මුදල් නිකුතුවේ අපහසුව, කුඩා කොටස් වලට බෙදීමේ හැකියාව, සමජාතීය බව., වටිනාකම ස්ථාවර වීම. සුළභ හෝ දුලභනොවීම. (එක් කරුණකට ලකුණු 1 බැගින උපරිම ලකුණු 4 කි.)

ii ශ්‍රී ලංකා මහ බැංකුවට අනුව මූල්‍ය ආයතන නම් කරන්න. (ල.3යි.)

මහ බැංකුව, බලපත්‍ර ලාභී වානිජ බැංකු, බලපත්‍ර ලාභී විශේෂිත වානිජ බැංකු, තැන්පතු භාර ගන්නා අනෙකුත් මූල්‍ය ආයතන, බලපත්‍රලාභී මුදල් සමාගම්, සමුපකාර හා ණය ගණුනෙු පිළිබඳ සමිති .

(එක් කරුණකට ල. 1 බැගින් ලකුණු 3 කි)

iii පහත දැක්වෙන්නේ එක්තරා වානිජ බැංකුවක ශේෂ පත්‍රයයි.

| වගකීම් | | වත්කම් | |
|---|---|---|---|
| ඉල්ලුම් තැන්පතු | 50000 | මුදල් සංචිතය<br>සුරැකුම් පත්<br>ණය | 7000<br>3000<br>40000 |
| | 50000 | | 50000 |

විචල්‍ය සංචිත අනුපාතිකය 10% ක් වේ.

i (අ)අධි සංචිත පවතීද?පිළිතුරට හේතු දක්වන්න. (ල.2යි.)

අධි සංචිතය 200 කි. (ල.1) 50000 x 10 /100 = 5000 මේ අනුව ව්‍යවස්ථාපිත සංචිතයට අනුකූලව ළඟ තබාගත යුත්තේ සංචිත ලෙස රු. 5000/= කි. නමුත් බැංකුවේ සංචිත රු.7000සංචිත පවතී. ඒ අනුව 7000 – 5000 = 2000 (ල.1)

ii පුද්ගලයෙක් චෙක්පතක් මගින් රු. 1500 ක තැන්පත් මෙම බැංකුවෙන් ආපසු ලබා ගන්නා ලදී. මෙසේ තැන්පතුව ආපසු ගත් පසු බැංකුවේ නව ශේෂ පත්‍රය පිළියෙල කරන්න ( ල. 3 යි.)

| වගකීම් | | වත්කම් | |
|---|---|---|---|
| ඉල්ලුම් තැන්පතු | 48500 | මුදල් සංචිතය<br>සුරැකුම් පත්<br>ණය | 5500<br>3000<br>40000 |
| | 48500 | | 48500 |

iii තැන්පත් මුදල් ආපසු ලබා ගත් පසු බැංකුවේ සංචිතය පිළිබඳව ඔබට කුමක් කිව හැකිද ? (ල.2 යි.)


නව අධි සංචිත ප්‍රමාණය = 5500 - 4800 = රු. 650

iv ශ්‍රී ලංකා මහ බැංකුව මෙම වෂර්යේ දී නිත්‍ය තැන්පතු අනුපාතය හා නිත්‍ය ණය අනුපාතය පහත දමන ලදී. මෙම නිත්‍ය තැන්පතු අනුපාතය හා නිත්‍ය ණය අනුපාතය යන්න පැහැදිළි කරන්න.(ල.4යි)

මහ බැංකුව අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳ පොලේ බිල්පත් ප්‍රති මිලදී ගන්නා විට,ලබා දෙන පොලී අනුපාතය නිත්‍ය තැන්පතු පොලී අනුපාතිකයයි .(පොළී අනුපාත කොරිඩෝවේ පහළ සීමාව වේ.) (ල.2)

මහ බැංකුව අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳ පොලේ බිල්පත් ප්‍රති විකුණුම් කරන විට, අය කරනු ලබන පොලී අනුපාතය නිත්‍ය ණය පොලී අනුපාතිකයයි . ((පොළී අනුපාත කොරිඩෝවේ ඉහළ සීමාව වේ.) ල.2)

v සුදුසු ප්‍රස්ථාර සටහන් උපයෝගී කර ගනිමින් වතුකම්කරුවන්ගේ වැටුප් වැඩි කිරීම නිසා එය රටතුළ උද්ධමනයට බලපාන ආකාරය පැහැදිළි කරන්න (ල.4යි.)




((ල.2)

රූප සටහනෙහි දැකවෙන ආකාරයට වැටුප් වැඩිවීම නිසා ශ්‍රම පිරිවැය වැඩි වී සැපයුම් වක්‍රය වමට විතැන් වේ.මේ නිසා මිල මට්ටම P සිට P1 දක්වා ඉහළ ගොස් ඇත. ඒ අනුව සැපයුම් පාශර්විය උද්ධමනයක පෙන්නම් කෙරේ. (ල.2)

(7) i බද්දක් පැනවීමේ දී තිබිය යුතු , "සාධාරණ බව" යන මූල ධමර්ය පැහැදිළි කරන්න. (ල.4 යි.)

මෙහි දී වැදගත් වන්නේ ඍජු බදු අයකිරීමේ දී සිරස් සමානාත්මතාවය හා සිරස් සමානාත්මතාවය පැවතීමයි.

සිරස් සමිනාත්මතාවයෙන් අදහස් වන්නේ වැඩි ආදායම් ලාභීන්ගෙන් වැඩි බදු ප්‍රතිශතයකුත් අඩු ආදායම් ලාභීන්ගෙන් අඩු බදු ප්‍රතිශතයකුත් අයකිරීමයි.

එසේම තිරස් සමානාග්මතාවයෙන් අදහස් වන්නේ සමාන ආදායම් ලාභීන්ගෙන් සමාන බලු ප්‍රතිශකයක් අයකිරීමත් ය.

එසේම පහළම ආදායම් ලබන්නන් බද්දෙන් නිදහස් කිරීමත් සාධාරන බව වේ. (ල.2)

රජය මහජනයාට විශාල සේවා රාශියක් නොමිලයේ ලබා දී ඒ වෙනුවෙන් යම් මුදලක් බදු වශයෙන් රජයට ලබා දීම ද සාධාරණ බව වේ.

ii රාජ්‍ය අයවැයෙහි වර්‍ර්න වියදම් සංරචක නම් කරන්න. (ල.3 යි)

- භාණ්ඩ හා සේවා ගිණුම
- රාජ්‍ය ණය සහ පොලී ගෙවීම්.
- වතර්න සංක්‍රාම. (එක් කරුණකට ලකුණු 1 බැගින් මුළු ලකුණු 3 කි)

iii ශ්‍රී ලංකාවේ රාජ්‍ය අයවැය ලේඛනයේ වතර්න ගිණුමේ හිඟයක් පවතින අතර, එය දිගින් දිගටම පුළුල් වෙමින් පවතී. එසේනම්, වතර්න ගිණමේ හිඟයක් යන්න පැහැදිළී කොට, එහි ප්‍රතිවිපාක සඳහන් කරන්න. (ල. 5යි)

රටක මුළු රාජ්‍ය ආදායමින් වර්‍ර්න වියදම් අඩු කළ විට ලැබෙන අගය ඍණ වේ නම්, එය වතර්න ගිණුමේ හිගයක් වේ. එසේත් නැත්නම්, මුළු රාජ්‍ය ආදායම ඉක්මවා පවතින වතර්න වියදම වතර්න ගිණමේ හිගය වේ. (ලකුණු 2 යි.)

- රාජ්‍ය ඉතුරුම් පහත වැටීම හෝ ඍණ වීම
- රාජ්‍ය ආයෝජනය අඩාල වීම.
- ප්‍රාග්ධන වියදම් සඳහා පවතින සම්පත්ප්‍රමාණය අඩුවීම.
- අයවැය හිඟය පුළුල් වම.
- අයවැය මූල්‍යකරණයේ ගැටළු ඇතිවීම.
- ණය බර අධිකවීම.
- දේශීය ආර්‍ථිකයට විදේශීය මැදිහත්වීම වැඩිවීම.

(එක් කරුණකට ලකුණු 1 බැගින් මුළු ලකුණු 3 කි)

iv අයවැය හිඟය පියවා ගැනීමේ ප්‍රසාරණාත්මක මූලයන් නම් කර එය පැහැදිළි කරන්න. (ල.4යි.)

අයවැය හිඟය පියවා ගැනීම සඳහා රජය දේශීයව හා විදේශීයව ණය ලබා ගනී. දේශීය වෙළෙඳ පොළ බැංකු අංශයන් තුළින් ණය ගැනීම නිසා මුදල් සැපයුම වැඩිවී රටතුළ උද්ධමනයක් ඇති වේ. එය අය වැය හිඟය පියවා ගැනීමේ ප්‍රසාරණාත්මක මූල්‍යයන් ලෙස හඳුන්වයි.

රජය බැංකුවෙන ණය ගැනීමේ දී මහ බැංකුව අලුතින් කාසි හා නෝට්ටු නිකුත් කර ණය ලබා දෙයි. ඒ නිසා මුදල් සැපයුම වැඩි වී රටතුළ උද්ධමනයක් ඇති වේ.

වානිජ බැංකු රජයට ණය දෙන්නේ , මුදල් මැවීම තුළිනි.එමගින් ද මුදල් සැපයුම වැඩි වී රටතුළ උද්ධමනයක් ඇති වේ.

v ශ්‍රී ලංකාව තුළ පවතින ආර්ථික අබර්ුදයත් සමග රාජ්‍ය ණය හා පොළී ආපසු ගෙවීම ගැටළුවක් වී ඇත. ඒ සඳහා වතර්මානයයේ ණය ප්‍රතිව්‍යුගත කිරීම පිළිබඳ අවධානය යොමුකර ඇත. එහි අරමුණු මොනවා ද? (ල.4යි.)

- ✓ මධ්‍යකාලීන හා දිගු කාලීන මූල්‍ය අවශ්‍යතාව සපුරා ගැනීම.
- ✓ දළ මූල්‍ය අවශ්‍යතාව සපුරා ගැනීම.
- ✓ ණය සේවා කරණ යාවත්කාලීන කිරීම.
- ✓ රාජ්‍ය ණය හා දළ දේශීය නිෂ්පාදනය අතර අනුපාතය අඩු කිරීම.

(8)i නිරපේක්ෂ වාසි න්‍යායේ හා සාපේක්ෂ වාසි න්‍යායේ පදනම කුමක් ද? (ල.2)

නිරපේක්ෂ වාසි න්‍යායේ පදනම අඩු පිරිවැය වේ. (අඩු යෙදවුම් ප්‍රමාණයකින් වැඩි නිමැවුමක්)(ල.1)

සාපේක්ෂ වාසි න්‍යායේ පදනම අඩු ආවස්ථික පිරිවැය වේ. (ල.1)

ii රටවල් දෙකක් සමබන්ධයෙන් නිෂ්පාදන ඒකකයත් සඳහා වැයවන ශ්‍රම පැය ගණන පහත දක්වා ඇත.මෙම රටවල් දෙක සතුව ශ්‍රම පැය 120 ක් පවතී.

| | උතුරු රට | දකුණු රට |
|---|---|---|
| X භාණ්ඩය | 60 | 10 |
| Y භාණ්ඩය | 30 | 20 |

(අ) භාණ්ඩ දෙක සම්බන්ධයෙන් කායර්ක්ෂම රට කුමක් ද? (ල.2)

කායර්ක්ෂම රට දකුණු රට වේ. හේතුව නිරපෙක්ෂ වාසිය අනුව දකුණු රට භාණ්ඩ දෙකම නිෂ්පාදනයට යොදා ගෙන ඇත්තේ අඩු පිරිවැයක් වන බැවිනි

(ආ) එක් ඒක් රට විශේෂීකරණ භාණ්ඩ අනුව හුවමාරු අනුපාත පරාසය දක්වන්න.(ල.4)


X භාණ්ඩය දකුණු රට විශේෂීකරණය කරයි. (ල.1යි)


හුවමාරු අනුපාත පරාසය X භාණ්ඩ 1 ට Yභාණ්ඩ 0.5 ට වැඩි හා 2 ට අඩු භාණ්ඩ ප්‍රමාණයකි (ල.1 යි)

Y භාණ්ඩය උතුරු රටවිශේෂීකරණය කරයි. (ල.1යි)

හුවමාරු අනුපාත පරිසය Y භාණ්ඩ 1 ට X භාණ්ඩ 2 ට අඩු හා 0.5 ට වැඩි භාණ්ඩ ප්‍රමාණයකි (ල.1 යි)

(ඉ) රටවල් දෙකෙහි නිෂ්පාදන හැකියාව හා පරිභෝජන හැකියාව රූප සටහන් ඇසුරින් පෙන්වන්න. (ල.4යි)





**නිවැරදි දත්ත වලට අඳින ලද නිෂ්පාදන හැකියා මායිමට ලකුණු 1 බැගින් ලකුණු 2 කි.**
**නිවැරදි දත්ත වලට අඳින ලද පරිභෝජන හැකියාවට ලකුණු 1 බැගින් ලකුණු 2 කි.**

iii පහත සඳහන් සිදුවීම් විනිමය අනුපාතයට කරනු ලබන බලපෑම ,රුපියල් ඉල්ලුම් සැපයුම් වෙළෙඳ පොළට අදාළ රූප සටහන් මගින් පෙන්වන්න. (රූප සටහන් වෙන වෙනම අඳින්න)

(අ) ශ්‍රී ලංකා ආර්ථිකය මෝටර් රථ ආනයනය කිරීම වැඩි කිරීම.





**( නිවැරදි රූප සටහනට ලකුණු 1 යි.)**

**රූප සටහනේ දැක්වෙන ආකාරයට මෝටර් රථ ගෙන්වීමට රුපියල් සැපයුම වැඩි කරයි .මේ නිසා (ඩොලරයේ ) (වෙන මුදලක් ගනු ලැබුවද මෙසේම සිදුවේ.) රුපියලේ අගය ක්ෂය වේ.**

**(නිවැරදි පැහැදිළි කිරීමට ල.1 යි.)**

(ආ)ඇමරික් එක්සත් ජනපදය මගින් ශ්‍රී ලංකාවේ ඇඟළුම් හා තේ මිලදී ගැනීම වැඩි කිරීම.





**(නිවැරදි රූප සටහනට ලකුණු 1 යි.)**

**රූප සටහනේ දැක්වෙන ආකාරයට ඇඟළුම් හා තේ සඳහා ඉල්ලුම වැඩිවීමෙන් රුපියල් ඉල්ලුම වැඩි කරයි .මේ නිසා ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය ඉහළ යයි.**

**(නිවැරදි පැහැදිළි කරීමට ල.1 යි.)**

(ඉ) විදේශ සංචාරකයින් ලංකාවට පැමිණීම දැඩි ලෙස ඉහළ යාම.





**(නිවැරදි රූප සටහනට ලකුණු 1 යි.)**

**රූප සටහනේ දැක්වෙන ආකාරයට සංචාරකයන්ගේ පැමිණීම වැඩිවීමෙන් රුපියල් ඉල්ලුම වැඩි වේ .මේ නිසා ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය ඉහළ යයි.**

**(නිවැරදි පැහැදිළි කරීමට ල.1 යි.)**

(ඊ) විදේශ රටවල ඉගෙනීම සඳහා ශ්‍රී ලාංකීය සිසුන් වැඩි වැඩියෙන් යොමුවීම.

(ල. 2 බැගින් මුළු ලකුණු 8 කි)




**( නිවැරදි රූප සටහනට ලකුණු 1 යි.)**

**රූප සටහනේ දැක්වෙන ආකාරයට විදේශවල ඉගෙනීමට ශ්‍රී ලංකීය සිසුන් යනවිට රුපියල් සැපයුම වැඩි කරයි .මේ නිසා (ඩොලරයේ ) (වෙන මුදලක් ගනු ලැබුවද මෙසේම සිදුවේ.) රුපියලේ අගය ක්ෂය වේ.** **(නිවැරදි පැහැදිළි කරීමට ල.1 යි.)**

(9) i ආර්ථික වෘද්ධිය හා ආර්ථික වෘද්ධි අනුපාතිකය යන්න ඔබ පැහැදිලි කරන්නේ කෙසේ ද? (ල.4යි)

ආර්ථික වර්ධනය / වෘද්ධිය යනු, නිෂ්පාදන ධාරිතාවය / හැකියාව අඛන්ඩව ඉහළ යාම තුළින් ආර්ථිකයේ මූතර් නිමැවුම දිගුකාලීනව අඛන්ඩව ඉහළයාම තුළින් ආර්ථිකයේ මූතර් නිමැවුම දිගුකාලීනව (අවම වශයෙන් වසර 8-10 ක්වත්) ඉහළ යාමකි. එහිදී කාලයත් සමග විභව නිමැවුම හෝ නිෂ්පාදන ධාරිතාවය ඉහළ යන නිසා නි.හැ. මා. වක්‍රය අඛණ්ඩව දකුණට විතැන් වීමක් දැකිය හැකිය.(ල.2)

ආර්ථික වෘද්ධි අනුපාතය යනු, කිසියම් කාල පරිච්ඡේද දෙකක් තුළ මූතර් නිමැවුම (ද.දේ.නිෂ්/ දළ ජාතික ආ.) වැඩිවීමේ වෙගයයි. එය වසර දෙකක් හෝ වසර කීපයක් ඇතුළත , වෂර් දෙකක් පෙන්නුම් කර ගනිමින් සාමාන්‍ය ප්‍රතිශතය මගිනු ද ලබා ගත හැකිය. එමගින් මැනෙනුයේ නිමැවුමේ හට ගත් සැබෑ වෙනස් වීමයි. (ල.1)

ආර්ථික වෘද්ධි අනුපාතිකය =

$$\frac{\text{වසර දෙක අතර මූතර් ද.දේ.නි. / ද.ජා.නිෂ. වෙනස}}{\text{පෙර වසරේ මූතර් ද.දේ. නිෂ්./ දළ ජා. නිෂ්.}} \times 100$$

(අදාළ සූත්‍රයට ල.1 යි.)

ii පංචමක අපකිරණ අනුපාතිකය යන්න පැහැදිලි කරන්න. (ල.3යි)

ආදායම් උපයන්නන්ගේ ඉහළම ආදායම් හිමිකර ගත් පංචමකයේ හෙවත් පස්වන පංචමකයේ සාමාන්‍ය ආදායම , පළමුවන පංචමකයේ සාමාන්‍ය ආදායම අතර අනුපාතයයි. (ල.2)

පංචමක අපකිරණ අනුපාතිකය =

$$\frac{\text{ඉහළම ආදායම උපයාගත් ගත් පංචමකයේ සාමාන්‍ය ආදායම් (20\%)}}{\text{පහළම ආදායම උපයාගත් ගත් පංචමකයේ සාමාන්‍ය ආදායම් (20\%)}} \times 100$$ (ල.1)

iii ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තිය හා ප්‍රජා විද්‍යාත්මක පාරිතෝෂිතය යන සංකල්ප පැහැදිලි කරන්න. (ල.4යි)

ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තිය ලෙස සැළකෙන්නේ රටක හෝ ප්‍රදේශයක කාලයක් තුළ නොවෙනස්ව ඉහළ මට්ටමක පැවති උපත් හා මරණ අනුපාතය යම් කාලයක් තුල දී වෙනස්වීම ආරම්භ කොට ක්‍රමයෙන් අඩු වී නැවත පහත් මට්ටමක නොවෙනස්ව පවතින තත්ත්වයකට පත්වීමයි. (ල.1)

මෙහි අදියර 4 ක් හමුවෙයි.

1. උපත් අනුපාතිකය හා මරණ අනුපාතිකය ඉහළ මට්ටමක පවතී.
2. උපත් අනුපාතිකය ඉහළ මට්ටමක පවතිද්දී , මරණ අනුපාතිකය ක්‍රමයෙන් අඩු වෙමින් පවතී.
3. මරණ අනුපාතය පහළ බැස තිබිය දී උපත් අනුපාතය ක්‍රමයෙන් අඩු වෙමින් පවතී.
4. උපත් අනුපාතය හා මරණ අනුපාතය යන දෙකම පහළ මට්ටමක නොවෙනස්ව පවතී. (ල.1)

ප්‍රජා විද්‍යාත්මක පාරිතෝෂිතය යනු. රටක අවුරුදු 15 ට අඩු ළමා ජනගහනයේ ප්‍රතිශතය 30% ට වඩා අඩුවීමත් අවුරුද් 60 සහ ඊට වැඩි ජනගහන ප්‍රතිශතය 15% කට වඩා අඩුවීමත්ය.

හෝ

ළමා හා වැඩිහිටි යැපුම් අනුපාත සාපේක්ෂ වශයෙන් ඉතා පහළ මට්ටමක වාතර්ා කරන විට එම කාලච්ඡේදයේ ආර්ථිකය මත යැපුම් පීඩන අඩු වීම නිසා එමගින් ඉතිරි වන සම්පත් ආර්ථික සංවධර්න ක්‍රියාවලියට යොදා ගැනීමට අවස්ථාවක් උදා වීමයි.

(එක් අර්ථ දැකවීමකට ලකුණු 2යි.)

iv මානව සංවධර්න දශර්කය ගණනයට අදාළ, සංරචක දක්වා එම දශර්කයේ වාසි 2 ක් දක්වන්න. (ල.4යි)

එක්සත් ජාතීන්ගේ මානව සංවර්ධන වැඩ සටහන යටතේ 1990 දී ඉදිරිපත් කරන ලද මානව සංවර්ධන දර්ශකය වතර්මානයේ ගණනය කරනු ලබන දර්ශක කීපයකි.

(අ) උපතේ දී ආයු අපේක්ෂාව :- මෙය දිගු කලක් ජීවත්වීමට දායක වන සෞඛ්‍ය පහසුකම් වල සුළබ බව පෝෂණ තත්ත්වය ආදී සංවර්ධනයෙහි බොහෝ අංශයන් ආවරණය කරයි.

(ආ) දැණුම :- මෙහි දී දැණුම විචල්‍යය උප දර්ශක දෙකක් යොදා ගනිමින් ඉදිරිපත් කරයි.

i පාසල් අධ්‍යාපනය ලැබූ වසර සංඛ්‍යාවේ මධ්‍යයනය

ii පාසල් අධ්‍යාපනය ලැබීමට ප්‍රවේශ වන දරුවෙකු අධ්‍යාපනයේ නිරත වෙතියි අපේක්ෂිත වසර ගණන

(ඇ) ක්‍රය ශක්ති සාම්‍ය ප්‍රතිශීෂර් දළ ජාතික ආදායම. :-

මෙහි දී ආදායමේ නිරපේක්ෂ මට්ටම පමණක් නොව එම ආදායමින් මිල දී ගත හැක්කේ කුමක් ද යන්න සළකා ඇත.තව ද අන්තර් ජාතික වශයෙන් සසඳා බැලීම සඳහා එක්සත් ජනපද ඩොලර් වලට ගලපන ලද මිලදී ගැනීමේ හැකියාව පෙන්නුම් කරන ඒක පුද්ගල මූතර් දළ ජාතික ආදායම සැළකිල්ලට ගෙන ඇත. ( දර්ශකයට අදාළ සංරචක නම් ල.2 යි)

මෙම මානව සංවර්ධන දර්ශකයෙහි ප්‍රබලතා හෙවත් වාසි කීපයක් දැක්විය හැකිය. එනම්,

1. මෙම දර්ශකය අධ්‍යාපනය, සෞඛ්‍ය, පෝෂණය ජීවන තත්ත්වය යන සංරචක ඇතුළත් සංයුක්ත දර්ශකයක් වීම.
2. ඒක පුද්ගල ආදායම් මට්ම මත ජීවන තත්ත්වයේ වෙනස්කම් හඳුනාගැනීම අපහස් නිසා ආදායම පමණක් නොව මෙහි දී සමාජයීය සාධක ද සැලකිල්ලට ගෙන තිබීම.
3. සංවර්ධන මට්ටම් අනුව ලෝකයේ රටවල් පෙළ ගැස්විය හැකිවීම.
4. මානව සංවර්ධනයේ අත්‍යාවශ්‍ය අංගයක් වන මිනිසාට තේරීම් කිරීමට තිබෙන පුළල් නිදහස ඒක ශීෂර් ආදායම පිළිබිඹු නොකළත් මෙමගින් එය පිළිබිඹු වීම. (වාසි දෙකකට ලකුණු 2 කි)

v සමාජ ආරක්ෂණ ජාල යන්න ,දරිද්‍රතාවය, අවධානම්කාරී තත්ත්වය , අසමානතාවය වැනි ගැටළු ආමන්ත්‍රණය කිරීමට වඩාත් යෝග්‍ය මෙවලමක් ලෙස ඉහළ පිළි ගැනීමකට ලක්ව ඇත. සමාජ ආරක්ෂණ ජාල යන්න අථර් දක්වා ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාතමක සමාජ ආරක්ෂණ ජාල වැඩ සටහන් දක්වන්න. (ල.5යි) ළමයින්, කාන්තාවන්, වියපත් පිරිස්, ආබාධිතයන් , අවතැන් වූ පිරිස් සේවා වියුක්තියෙන් පෙලෙන්නන් සහ රෝගීන් වැනි දුප්පත් සහ අනාරක්ෂිත තත්ත්වයක සිටින අයරක බලා ගැනීමට සහ උපකාර කිරීමට අදාළ පවත්නා වැඩ සටහන්ය. (ලකුණු 2 යි.)

ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක සමාජ ආරක්සණ වැඩ සටහන් නම්,

- සමුර්ධී සහ ඒ හා බැඳුනු අස්වැසුම වැඩ සටහන.
- අවුරුදු 70 ට වැඩි ජොෂ්ඨ පුරවැසියන්ට දෙනු ලබන දීමනා.
- ගැබිනි මව්වරුන් සඳහා ආධාර ( ත්‍රිපේෂ ආහාර ආධාර ආදී පෝසණ මල්ල)
- පාසැල් දිවා ආහාරය.
- ආබාධිත සොල්දාදුවන්ට සහ ගැටුම් වලින් මියගිය ආරක්ෂක හමුදා සාමාජිකයන්ගේ පවුල් වලට ලබා දෙන ආධාර.
- මාසික පිංපඩි (මහජන ආධාර මාසික දීමනාව)
- ළඳරු පාසල් දරුවන්ට නැවුම් කිරි ලබා දීම.
- නියඟය, ගංවතුර, සුළි සුලං වැනි ස්වාභාවික ආපදා වලට මුහුණ දෙන හදිසි ආපදා ආධාර

(ඕනෑම එක් කරුණකට ලකුණු ඒක බැගින් කරුණු 3 කට ලකුණු 3කි.)

(10) i සිව්වන කාමරීක විප්ලවය (4IR) යනුවෙන් කුමක් අදහස් වේ ද? ශ්‍රී ලංකාව පසුවනුයේ කීවෙනි කාමරීක විප්ලවයේ ද? (ල.4යි.)

සිව්වන කාරමික විප්ලවය (4 IR) යනු. අන්තජර්ාලීය සේවා ( Inter Net of Thinks) රොබෝ විද්‍යාව, අතත්‍ය යතාථර්ය (virtual Reality ) 3D මුද්‍රණය, කෘතිම බුද්ධිය (Artifycial Interligence)

කඩාකප්පල් කාරී තාක්ෂණය වැනි ප්‍රවනතා ඔස්සේ අපගේ ජන ජීවිතය හා වැඩ ලෝකය පිළිබඳව වතර්මානයේ සිදුවෙමින් පවත්නා සීඝ්‍ර වෙනස්කම්ය. නූතන ජීවන රටාවතට අත්‍යාවශ්‍යම දේ බවට ශීඝ්‍රයෙන් පැතිර යන බොහෝ භෑණ්ඩ හා සේවා බිහිව ගිබෙනුයේ, මෙම සිව්වන කාමරීක විප්ලවයේ ප්‍රතිඵලයකි . උදාහරණ ලෙස, (GPS ) පද්ධතිය (Siri) (Netfix) යනාදිය දැක්විය හැකිය. (ල.3)
ශ්‍රී ලංකාව තවම පසු වන්නේ දෙවන කමරීක විප්ලවයේය. (2 IR) (ල. 1)

ii නිදහසින් පසු කාලයක් තිස්සේ ශ්‍රී ලංකාවට ඉහළ ආර්ථීක වෘද්ධී අනුපාතිකයක් පවත්වා ගැනීමට අපොහොසත් වූ සාධකයන් කවරේ ද? (ල.4යි.)

ශ්‍රී ලංකාවට නිදහසින් පසු ඉහළ ආර්ථීක වෘද්ධී අනුපාතයක් පවත්වා ගැනීමට අපොහොසත් වී තිබෙන්නේ, පහත සඳහන් ප්‍රධාන කරුණු නිසයි.

-ජන වාගරීත ගැටළු මෙන්ම සිවිල් අරගල පැවතීම.

- වඩාත් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි ප්‍රතිපත්ති වෙනුවට විවිධ දෘෂ්ඨී වාද මත ප්‍රතිපත්ති තීරණය වීම.

- ආර්ථීක කරණු වලට වඩා දේශපාලනික කරුණු හා ආගමික කරුණු ගැන අවධානය යොමු කිරීම.

- අපනයන ක්ෂේත්‍රයෙහි මන්දගාමී වධර්නය ප්‍රබලවී තිබීම.

- නිතර සිදුවන ආණ්ඩු වෙනස්වීම් හා ආර්ථීක ප්‍රතිපත්ති පිළිබද නිශ්චිතතාවක් නොමැති වීම.

(ඕනෑම කරුණකට ලකුණු 1 බැගින් ලකුණු 4 කි)

iii ශ්‍රී ලංකාව, ආසියාවේ ප්‍රධානම සංචාරක මධ්‍යස්ථානයක් ලෙස පත් කර ගැනීමේ දී මුහුණ දෙන අභියෝගයන් කවරේ ද? (ල.4යි.)

- ගෝලීය ආර්ථීකයේ ඉඩ ප්‍රස්ථා ප්‍රයෝජනයට ග නිමින් අපනයන ප්‍රවධර්නයට කටයුතු නොකිරීම.
- ශ්‍රම බලකායේ තාක්ෂික නිපුණතා සංවධර්නය නොවීම.
- ඇතැම් යුග වලදී අභ්‍යන්තරාභිමුඛ ආර්ථීක ප්‍රතිපත්තියක් කරා යොමු වීම තුලින් ආයෝජනයක් තුළ ඇති වූ අවිනිශ්චිතතා නිසා ආයෝජනය අඩුවීම.
- අසතුටුදායක දේශපාලන තත්ත්වය , අයහපත් වෙළෙඳ අනුපාත, ගෝලීය මූල්‍ය අභර්බුද , ඉන්ධන මිල ඉහළ යාම .

(ඕනෑම එක් කරුණකට ලකුණු එක බැගින් කරුණු 4 ට ලකුණු 4 කි.)

iv පහත සඳහන් ගෝලීය දශර්ක අනුව ශ්‍රී ලංකාවේ වතර්මාන තත්ත්වය කුමක් ද? (ලකුණු 8 කි)

(අ) ව්‍යාපාර පවත්වා ගෙන යාමේ පහසුව පිළිබඳ දශර්කය .
Ease of doing Business Index
රටවල් 199 ක් අතුරින් 99 වන ස්ථානය (2020)

(ආ) ගෝලීය තරඟකාරිත්ව දශර්කය.
Globle Competitivenes Index
රටවල් 141 ක් අතුරින් (2020) 84 වන ස්ථානය

(ඉ) දූෂණ සංජානන දශර්කය Corruption perception Index
රටවල් 180 ක් අතුරින් 2022 = 101 ස්ථානය
2023 = 115 ස්ථානය

(ඊ) ගෝලීය සන්තුෂ්ඨික දශර්කය Globle Happeness Index
රටවල් 132 ක් අතුරින් 2022 = 127 වන ස්ථානය
2023 = 112 වන ස්ථානය

(අදාළ දත්ත යාවත්කාලීන වී තිබේ නම්, නිවැරදි දත්ත වලට ලකුණු ලබා දෙන්න.)
(ල. 2x 4 )

❁❁❁



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

## කෙටි ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| **1** | 4 | **11** | 5 | **21** | 5 | **31** | 3 | **41** | 1 |
| **2** | 3 | **12** | 4 | **22** | 1 | **32** | 3 | **42** | 1 |
| **3** | 4 | **13** | 3 | **23** | 2 | **33** | 4 | **43** | 2 |
| **4** | 5 | **14** | 4 | **24** | 4 | **34** | 2 | **44** | 2 |
| **4** | 5 | **15** | 4 | **25** | 4 | **35** | 5 | **45** | 3 |
| **6** | 1 | **16** | 2 | **26** | 5 | **36** | 1 | **46** | 1 |
| **7** | 5 | **17** | 4 | **27** | 3 | **37** | 3 | **47** | 2 |
| **8** | 1 | **18** | 4 | **28** | 2 | **38** | 1 | **48** | 5 |
| **9** | 4 | **19** | 2 | **29** | 4 | **39** | 2 | **49** | 2 |
| **10** | 2 | **20** | 5 | **30** | 2 | **40** | 5 | **50** | 1 |


(30) WWW.PastPapers.WiKi (30)
Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

**සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට**

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න